# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2022 මැයි මස 06 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2022.05.06 දින නිකුත් කරන ලදී)**


# විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

*(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)*

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

**මිල : රු. 105.00** | **තැපැල් ගාස්තුව : රු. 45.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මෙම පනත විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

2. (මෙහි මින් මතු "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

(අ) 4 වන ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ "ජනතාව විසින් තෝරා පත්කර ගනු ලබන ජනරජයේ ජනාධිපති විසින් ක්‍රියාත්මක කළ යුත්තේය." යන වචන වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට ජනාධිපතිවරයා සහ කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුත්තේය." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) 4 වන ව්‍යවස්ථාවේ (ඉ) ඡේදයේ "ජනරජයේ ජනාධිපතිවරයා තෝරා පත්කිරීමේ ඡන්ද විමසීමක දී ද," යන වචන ඉවත් කිරීමෙන්.

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

(අ) 30 වන ව්‍යවස්ථාවේ (1) ඡේදයේ "ආණ්ඩුවේ ප්‍රධානයා ද" යන වචන ඉවත් කර එම 30 වන ව්‍යවස්ථාවේ (1) වන ව්‍යවස්ථාවේ "ජනරජයේ" යන වචනයට ඉක්බිතිව "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු වූ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) 30 වන ව්‍යවස්ථාවේ (2) ඡේදයේ "ජනතාව විසින් තෝරා පත්කර ගනු ලැබිය" යන වචන වෙනුවට "පාර්ලිමේන්තුව විසින් මේ ව්‍යවස්ථාවේ (3) වන ඡේදයේ

විධිවිධාන සලස්වා ඇති ආකාරයට තෝරා පත් කර ගත" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) 30 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදයේ "පස් අවුරුදු කාලයක්" යන වචනවලට පෙරාතුව "සාමාන්‍යයෙන්" යන වචනය ඇතුළත් කිරීමෙන්;

(ඈ) 30 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අතුරු විධාන ඇතුළත් කිරීමෙන්:-

"එසේ වුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මීට පටහැනිව කුමක් සඳහන් වුව ද, ජනාධිපතිවරයා වශයෙන් එසේ තෝරා පත් කර ගනු ලබන තැනැත්තා, තමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව කලින් ධුරය දැරීම අවසන් වන්නේ නම් මිස, ඊළඟ පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයකු තෝරා පත් කරනු තබන තෙක් අඛණ්ඩව ධුරය දරනු ලැබිය යුත්තේය:

එසේම තවදුරටත්, ස්වකීය තෝරා පත් කිරීමේ දින සිට අවුරුදු පහක කාලසීමාවක් අවසන් වී නොතිබීම පිළිබඳ කරුණු නොසලකා ඊළඟ පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයකු තෝරා පත් කරනු ලැබීම සමඟම එවැනි තැනැත්තකු විසින් ධුරය දැරීම අවසන් වන්නේය."

(ඉ) 30 වන ව්‍යවස්ථාවේ (3), (4), (5) සහ (6) වන ඡේද වශයෙන් බලාත්මක විය යුතු 30 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:-

"(3) 88 වන ව්‍යවස්ථාව යටතේ සුදුසුකම් ලබා ඇති සහ 89 සහ 92 ව්‍යවස්ථා යටතේ නුසුදුස්සකු වී නොමැති යම් පුරවැසියකු පාර්ලිමේන්තුව විසින් නීතිය මඟින් විධිවිධාන සලස්වනු ලබන කාර්ය පටිපාටිය ප්‍රකාරව රහසිගත ඡන්දය මගින් පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරයේ සිට සති හතරක කාලයක් ඇතුළත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සාමාන්‍ය බහුතර ඡන්දයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, පාර්ලිමේන්තුව විසින් එවැනි නීතියක් පනවන තෙක්, 1981 අංක 2 දරන ජනාධිපතිවරණ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන සුදුසු වෙනස්කම් සහිතව අදාළ විය යුතු ය.

(4) මිය යෑම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීමෙන් ධුරයේ පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, එම පුරාප්පාඩුව පිරවීම සඳහා මේ ව්‍යවස්ථාවේ (3) වන ඡේදය ප්‍රකාරව පුරප්පාඩුව ඇති වී සති හතරකට වඩා වැඩි නොවන කාලයක් තුළ දී ඡන්ද විමසීමක් පවත්වනු ලැබිය යුතු ය. එම පුරප්පාඩුව පිරවීම සඳහා තෝරා පත් කර ගනු ලබන තැනැත්තා ඉතිරි ධුර කාලය සඳහා ධුරය දරනු ලැබිය යුතු යः

එසේ වුව ද, ඉහත කී පරිදි ජනාධිපති ධුරය පුරප්පාඩු වුවහොත්, එම පුරප්පාඩුව පිරවීම සඳහා පාර්ලිමේන්තුව විසින් පුද්ගලයකු තෝරා පත් කර ගන්නා තෙක් කථානායකවරයා ජනාධිපති ලෙස වැඩ බැලිය යුතු යः

එසේ වුව ද, පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසු ජනාධිපති ධුරය පුරප්පාඩු වුවහොත්, නව පාර්ලිමේන්තුව මගින් හැකි ඉක්මනින් ජනාධිපතිවරයෙකු තෝරා පත් කර ගත යුතු අතර, කථානායක ධුරය දැරූ පුද්ගලයා (පාර්ලිමේන්තුවේ නව කථානායකවරයකු තෝරා පත් කර ගැනීම නොතකා), නව ජනාධිපතිවරයෙකු තෝරා පත් කර ගන්නා තෙක් දිගටම ජනාධිපති ලෙස වැඩ බැලීම කළ යුත්තේ යः

එසේ වුව ද, කථානායකරවයාට එසේ ජනාධිපති ධුරයේ වැඩ බැලීමට නොහැකි නම්, එම කාලසීමාව තුළ නියෝජ්‍ය කථානායකවරයා ජනාධිපති ලෙස වැඩ බැලිය යුතු ය.

(5) ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගනු ලබන තැනැත්තකු තමා ජනාධිපතිවරයා වශයෙන් ධුරය දරන තාක් දුරට යම් දේශපාලන පක්ෂයක ධුර දැරීම හෝ සාමාජිකයෙකු වීම සිදු නොකළ යුතු ය.

(6) ජනතාව සහ/හෝ පාර්ලිමේන්තුව විසින් දෙවරක් ජනාධිපති ධුරයට තේරී පත් වූ තැනැත්තෙකු, එක් එක් ධුර කාලයේ කාලසීමාව කෙසේ වෙතත්, පාර්ලිමේන්තුව විසින් එම තනතුරට තේරී පත්වීමට නුසුදුස්සකු වන්නේය.”.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වන ව්‍යවස්ථාව අහෝසි කිරීම

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ:-

"ජනාධිපතිවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

33. (1) ජනාධිපතිවරයාගේ කාර්යය විය යුත්තේ:

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කරන බවට ද, ආරක්ෂා කරන බවට ද වග බලා ගැනීම;

(ආ) ජාතික ප්‍රතිසන්ධානය සහ ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම; සහ

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සහ VIIඅ ව්‍යවස්ථාවේ සඳහන් ආයතනවල නිසි ක්‍රියාකාරිත්වය පහසු කරලීම.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ වෙනත් ලිඛිත නීතියකින් හෝ ප්‍රකාශිතවම ජනාධිපතිවරයා වෙත පවරා හෝ නියම කර ඇත්තා වූ බලතලවලට සහ කාර්යයන්ට අමතරව, ජනාධිපතිවරයාට-

(අ) පාර්ලිමේන්තුවේ මංගල රැස්වීම්වල මුලසුන දැරීමට බලය ඇත්තේ ය;

(ආ) තානාපතිවරයන්, මහකොමසාරිස්වරයන්, පූර්ණාධිකාරී රාජ්‍ය දූතයන් හා වෙනත්

තානාපති නියෝජිතයන් පත් කිරීමට හා ඔවුන්ට බලතල පැවරීමට ද, ඔවුන් පිළිගැනීමට ද බලය ඇත්තේ යඃ

එසේ වුව ද, තානාපතිවරුන්, මහ කොමසාරිස්වරුන්, පූර්ණාධිකාරී රාජ්‍ය දූතයන් හා වෙනත් තානාපති නියෝජිතයන් පත් කිරීමේදී සහ ඔවුන්ට බලතල පැවරීමේ දී, ජනාධිපතිවරයා අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් අනුව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

(ඇ) නීතිඥ වෘත්තියෙහි විශිෂ්ටත්වයට පත්ව ඇත්තා වූ ද, පැවැත්මෙහි හා වෘත්තීය කටයුතු පිළිබඳ අවංකභාවයෙහි උත්කෘෂ්ඨ තත්ත්වයක් පවත්වාගෙන ඇත්තා වූ ද නීතිඥවරයන්, ජනාධිපති නීතිඥවරයන් වශයෙන් පත් කිරීමට බලය ඇත්තේ ය. මේ ඡේදය යටතේ පත් කරනු ලබන සෑම ජනාධිපති නීතිඥවරයකුටම ඒ දක්වා රාජ නීතිඥවරයන් විසින් භුක්ති විඳින ලද සියලු වරප්‍රසාදවලට හිමිකම ඇත්තේ ය;

(ඈ) ජනරජයේ රාජ්‍ය මුද්‍රාව භාරයේ තබා ගැනීමට ද, අග්‍රාමාත්‍යවරයා ද අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් අමාත්‍යවරයන්ද, ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ අනෙකුත් විනිශ්චයකාරවරයන් ද සහ අභියාචනාධිකරණයේ අනෙකුත් විනිශ්චයකාරවරයන් ද පත් කිරීමේ අධිකාර පත්‍රවල සහ ජනරජයට අයත් අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ අනෙකුත් විනිශ්චයකාරවරයන් ද පත් කිරීමේ අධිකාර පත්‍රවල සහ ජනරජයට අයත් වූ ද ප්‍රදානය කිරීමට හා පවරාදීමට

ජනාධිපතිවරයාට නීතියෙන් නියමව ඇත්තා වූ නැතහොත් බලය පැවරී ඇත්තා වූ ද, ඉඩකඩම් හා අනෙකුත් නිශ්චල දේපළ ප්‍රදානය කිරීමේ දී හෝ පවරා දීමේ දී, ඒ සම්බන්ධ ප්‍රදාන පත්‍රවල හා පැවරුම් පත්‍රවල රාජ්‍ය මුද්‍රාව තබා, අත්සන් කිරීමට ද, රාජ්‍ය මුද්‍රාව තැබිය යුතු වෙනත් සෑම ලේඛනයක ම රාජ්‍ය මුද්‍රාව තබා අත්සන් කිරීමට ද බලය ඇත්තේ ය.

(ඉ) යුද්ධය ප්‍රකාශ කිරීමට සහ සාමය ප්‍රකාශ කිරීමට බලය ඇත්තේය; සහ

(ඊ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට පටහැනි නොවන්නා වූ ද, ජාත්‍යන්තර නීතිය, චාරිත්‍ර වාරිත්‍ර හෝ භාවිතය අනුව ඉටු කිරීමට ජනාධිපතිවරයාට බලය ලැබී ඇත්තා වූ හෝ නියමිතව ඇත්තා වූ ද සියලු ක්‍රියා හා දේ කිරීමට බලය ඇත්තේ ය.”.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33අ සහ 33ආ වන ව්‍යවස්ථා එකතු කිරීම

**6.** පහත දැක්වෙන අලුත් ව්‍යවස්ථා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33අ සහ 33ආ යන ව්‍යවස්ථා ලෙස බල පැවැත්විය යුත්තේය:-

“ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතු බව

33අ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද, මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් තත් කාලයේ බලපවත්නා නීතිය ඇතුළු යම් ලිඛිත නීතියක් යටතේ ද, ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය යථා පරිදි ක්‍රියාත්මක කිරීම සහ යථා පරිදි ඉටුකිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුත්තේ ය.

ජනාධිපතිවරයා අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත කටයුතු කළ යුතු බව

33ආ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රකාශිතවම වෙනත් ආකාරයකින් සඳහන් වී ඇති අවස්ථාවන්හි දී හැර, සෑම විටම ජනාධිපතිවරයා ක්‍රියා කළ යුත්තේ අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මතය.”.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම**

**7.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාව ලෙස පහත සඳහන් නව ඡේදය එකතු කිරීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(4) මෙම ව්‍යවස්ථාවේ ප්‍රතිවිරුද්ධ කුමක් සඳහන් වුවත්, මෙම ව්‍යවස්ථාවේ (1), (2) සහ (3) අනුව්‍යවස්ථාවල නිශ්චිතව දක්වා ඇති කිසිදු බලතලයක්, අග්‍රාමාත්‍යවරයාගේ සහ විපක්ෂ නායකවරයාගේ යන දෙපක්ෂයේම එකඟතාව ඇතිව මිසක්, ජනාධිපතිවරයා විසින් ක්‍රියාත්මක නොකළ යුතුය.".

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම**

**8.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එහි (1) වන අනුව්‍යවස්ථාවේ දෙවන අතුරු විධානයේ '(උ) අනුව්‍යවස්ථාව' යන වචන ඉවත් කර, ඒ වෙනුවට '(2) අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදය' යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එහි (3) වන අනුව්‍යවස්ථාවේ "44 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාට පවරා ඇති නැතහොත් ඔහුගේ භාරයේ තිබෙන යම් විෂයයකට හෝ කාර්යයකට සම්බන්ධ යම් බලයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව කවර වූ හෝ අධිකරණයක පැවැත්වෙන නඩු කටයුතුවලට හෝ" යන වචන ඉවත් කිරීමෙන්;

(ඇ) එහි (3) වන ඡේදයේ අතුරු විධානය ඉවත් කිරීමෙන්.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 37 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම**

**9.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 37 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කර, නව (1) අනුව්‍යවස්ථාව ලෙසඃ

"(1) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා ස්වකීය ධුරයට අයත් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට නොහැකි වන්නේ නම්, එම කාලය තුළ, එම ධුරයට

අයත් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට ජනාධිපතිවරයා විසින් කථානායකවරයාව ජනාධිපති ධුරයේ වැඩ බැලීමට පත්කළ යුත්තේ යඃ

එසේ වුව ද, කථානායකවරයාට එසේ ජනාධිපති ධුරයේ වැඩ බැලීමට නොහැකි නම්, එම කාලසීමාව තුළ ජනාධිපති ධුරයේ බලතල, රාජකාරි සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට, නියෝජ්‍ය කථානායකවරයාව ජනාධිපති ධුරයේ වැඩ බැලීමට පත්කළ යුත්තේ ය."

යන වචන ආදේශ කිරීමෙන්ඃ

(ආ) (2) වන අනුව්‍යවස්ථාවේ "කථානායකවරයා විමසීමෙන් පසුව" යන වචන ඉවත් කර ඒ වෙනුවට "අග්‍රාමාත්‍යවරයා විමසීමෙන් පසුව" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) (2) වන අනුව්‍යවස්ථාවේ "කථානායකවරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුත්තේ ය. එවිට අග්‍රාමාත්‍යවරයා" යන වචන ඉවත් කර ඒ වෙනුවට "අග්‍රාමාත්‍යවරයා වෙත ලියවිල්ලකින් දැනුම්දිය යුත්තේ ය. එවිට කථානායකවරයා"

යන වචන ආදේශ කිරීමෙන්;

(ඈ) (2) වන අනුව්‍යවස්ථාවේ "තව ද, මෙම ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි පත්කිරීමක් කරනු නොලැබ තිබුණ ද, එම කාලසීමාව තුළ අග්‍රාමාත්‍ය ධුරයේ වැඩ බැලීම පිණිස ඔහු විසින් අමාත්‍ය මණ්ඩලයේ වෙනත් අමාත්‍යවරයකු පත්කළ යුත්තේ ය" යන වචන ඉවත් කිරීමෙන්; සහ

(ඉ) (2) වන අනුව්‍යවස්ථාවේ අතුරු විධානය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට නව අතුරු විධානය ලෙසඃ

"එසේ වුව ද, කථානායකවරයාට එසේ ජනාධිපති ධුරයේ වැඩ බැලීමට නොහැකි නම්, එම කාලසීමාව තුළ නියෝජ්‍ය කථානායකවරයා ජනාධිපති ධුරයේ වැඩ බැලිය යුතු අතර ජනාධිපති ධුරයේ බලතල, රාජකාරි සහ කාර්යයන් ක්‍රියාත්මක කළ සහ ඉටු කළ යුත්තේ ය."

යන වචන ආදේශ කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**10.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ:

"(2) පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරුන් සංඛ්‍යාවෙන් මන්ත්‍රීවරුන් තුනෙන් එකකට නොඅඩු සංඛ්‍යාවක් අත්සන් කර ඇති, කථානායකවරයාට යවන ලද ජනාධිපතිවරයාට එරෙහි ලිඛිත විශ්වාසභංග යෝජනා සම්මත දැන්වීමක් මත, ජනාධිපතිවරයාට එරෙහි විශ්වාසභංග යෝජනාවක්, මුළු මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාවෙන් (නොපැමිණෙන මන්ත්‍රීවරුන් ද ඇතුළුව) අඩකට නොඅඩු සංඛ්‍යාවකින් පාර්ලිමේන්තුව සම්මත කරන්නේ නම්, එම යෝජනා සම්මතය සම්මත කිරීමත් සමගම ජනාධිපති ධුරය පුරප්පාඩු වන්නේය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 39 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

11. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 39 වන ව්‍යවස්ථාව මෙයින් පහත පරිදි සංශෝධනය කෙරේ:-

(අ) එහි (2) වන අනුව්‍යවස්ථාවේ "කාලය තුළ අග්‍රාමාත්‍යවරයා, යන වචන ඉවත් කොට, ඒ වෙනුවට "කාලය තුළ කථානායකවරයා" වචන වෙනුවට ආදේශ කිරීම මගින්;

(ආ) එහි (2) වන අනුව්‍යවස්ථාවේ "යුතු අතර, අමාත්‍ය මණ්ඩලයේ වෙනත් අමාත්‍යවරයකු අග්‍රාමාත්‍ය ධුරයේ වැඩ බැලීම සඳහා පත් කළ යුත්තේය, යන වචන ඉවත් කර, ඒ වෙනුවට "යුතුය" යන වචනය ආදේශ කිරීමෙන්;

(ඇ) (2) වන අනුව්‍යවස්ථාවේ අතුරු විධානය ඉවත් කර, ඒ වෙනුවට පහත නව අතුරු විධානය ආදේශ කිරීමෙන් :

"එසේ වුව ද, කථානායකවරයාට එසේ ජනාධිපති ධුරයේ වැඩ බැලීමට නොහැකි නම්, එම කාලසීමාව තුළ නියෝජ්‍ය කථානායකවරයා ජනාධිපති ධුරයේ වැඩ බැලිය යුතු අතර ජනාධිපති ධුරයේ බලතල, රාජකාරි සහ කාර්යයන් ක්‍රියාත්මක කළ සහ ඉටු කළ යුත්තේය.".

**12.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වන ව්‍යවස්ථාව අහෝසි කිරීම

**13.** 41 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ අතුරු විධානය වශයෙන් බලපැවැත්විය යුතු පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 වන ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 වන ව්‍යවස්ථාව අහෝසි කිරීම

"එසේ වුව ද, එසේ පත්කරනු ලබන ලේකම්වරුන්ගේ, නිලධරයන්ගේ සහ කාර්ය මණ්ඩලයේ උපරිම ගණන අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.".

**14.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ පරිච්ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන පරිච්ඡේදය ආදේශ කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ පරිච්ඡේදය ප්‍රතියෝජනය කිරීම

"VIIඅ පරිච්ඡේදය

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය

41අ. (1) පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වන (මේ පරිච්ඡේදයේ "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් තිබිය යුත්තේය:

(අ) කථානායකවරයා;

(ආ) අග්‍රාමාත්‍යවරයා;

(ඇ) පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකවරයා;

(ඈ) අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා යන දෙදෙනාගේ ම

නාමයෝජනා කිරීම මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු වූ ද, තැනැත්තන් පස්දෙනෙක්; සහ

(ඉ) අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා අයත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් හෝ නොවන පාර්ලිමේන්තුවේ නියෝජනය ඇති අනෙකුත් දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම්වල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතරයේ එකඟත්වය මත නාම යෝජනා කොට ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන තැනැත්තෙකු.

(2) කථානායකවරයා සභාවේ සභාපතිවරයා විය යුත්තේය.

(3) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදය හෝ (ඉ) ඡේදය යටතේ වන පත් කිරීම් සඳහා වූ නාම යෝජනා, ඒ නාම යෝජනා කිරීමේ අවශ්‍යතාවය පැනනඟින කවර හෝ අවස්ථාවන්හි දී සිදුකිරීමට වග බලා ගැනීම කථානායකවරයාගේ කාර්යය වන්නේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදයේ සඳහන් තැනැත්තන් පස් දෙනා නම් කිරීමේ දී අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් වෘත්තීය සහ සමාජීය විවිධත්වය ඇතුළුව ශ්‍රී ලංකීය සමාජයේ බහුත්ත්ව ලක්ෂණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් පිළිබිඹුවන බව සහතික වීම පිණිස, පාර්ලිමේන්තුවේ නියෝජනය වන දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වල නායකයන්ගේ අදහස් විමසිය යුත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදය යටතේ පත් කරනු ලබන්නා වූ තැනැත්තන්

විශිෂ්ටත්වයෙන් හා අවංකභාවයෙන් යුත් පොදු වෘත්තීය ජීවිතයේ දී කීර්තිය ලත්, කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකයන් නොවන තැනැත්තන් විය යුතු අතර ඔවුන් නම් කරනු ලැබීම පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබිය යුත්තේ ය.

(6) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) සහ (ඉ) ඡේද යටතේ කරන ලද නාම යෝජනා නිශ්චිතව දක්වමින් ලිඛිත දැනුම් දීමක් ජනාධිපතිවරයා වෙත ලැබී දින දහහතරක් ඇතුළත ජනාධිපතිවරයා විසින් ඒ අවශ්‍ය පත්කිරීම් කරනු ලැබිය යුත්තේ ය. එකී දින දහහතරක කාල පරිච්ඡේදය ඇතුළත අවශ්‍ය පත් කිරීම් කිරීමට ජනාධිපතිවරයා අපොහොසත් වන විටෙක, නාම යෝජිත තැනැත්තන්, එකී කාල පරිච්ඡේදය අවසන් වූ දින සිට බල පවත්වන පරිදි සභාවේ සාමාජිකයන් ලෙස පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(7) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, අග්‍රාමාත්‍යවරයා, විරුද්ධ පක්ෂයේ නායකවරයා සහ කථානායකවරයා එකී විසුරුවා හැරීමට පසුව පවත්වනු ලබන මහමැතිවරණයට ඉක්බිතිව අවස්ථාවෝචිත පරිදි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් කථානායකවරයා හෝ අග්‍රාමාත්‍යවරයා ලෙස පත්කරනු ලබන තෙක් හෝ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකයා ලෙස පිළිගනු ලබන තෙක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් ලෙස තවදුරටත් ධුර දැරිය යුත්තේ ය.

(8) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදය සහ (ඉ) ඡේදය යටතේ පත් කරන ලද සභාවේ සෑම සාමාජිකයකු ම විසින්, ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් ඔහුගේ ධුරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ ඔහු තම ධුරයේ කටයුතු තවදුරටත් කරගෙන යාමට නොහැකි ශාරීරික හෝ මානසික අශක්නුතාවයකට පත්ව ඇති බවට අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා යන දෙදෙනාම මතයක් ඇති කර ගන්නා අවස්ථාවක

ඒ මත ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ඔහු වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු විෂයයෙහි ප්‍රජා අශක්නුතා නියම කිරීමේ යෝජනා සම්මතයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන ව්‍යවස්ථාවට අනුකූලව සම්මත කරනු ලැබ ඇත්නම් හෝ 41ඉ ව්‍යවස්ථාවේ (7) වන අනුව්‍යවස්ථාව යටතේ ඔහු සිය ධුරය හැර ගියාක් සේ සළකනු ලබන්නේ නම් හෝ මිස, එවැනි සාමාජිකයෙකු වශයෙන් ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුත්තේය.

(9) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඈ) ඡේදය හෝ (ඉ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයන් අතර පුරප්පාඩුවක් ඇති වූ විටක, එම පුරප්පාඩුව ඇති වීමේ දින සිට දින දහහතරක් ඇතුළත, ඉහත සඳහන් ඡේදයන්හි විධිවිධාන සැළකිල්ලට ගනිමින් ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්ත වීම පිණිස වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුත්තේ ය. එසේ පත් කරනු ලැබූ යම් තැනැත්තෙක්, ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයෙකු වෙනුවට ද, ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව තිබෙන කොටස සඳහා ධුරය දැරිය යුත්තේ ය.

(10) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඈ) ඡේදය හෝ (ඉ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයකු, එම ඡේද යටතේ අඛණ්ඩ වාරයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් නොවන්නේ ය.

(11) මේ ව්‍යස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඈ) ඡේදය සහ (ඉ) ඡේදය යටතේ ජනාධිපතිවරයා විසින් කරනු ලබන පත්වීම් කථානායකවරයාට දැනුම් දිය යුත්තේ ය.

සභාව විසින් පත් කිරීම් නිර්දේශ කළ යුතු බව

41ආ. (1) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස හෝ ජනාධිපතිවරයා විසින්

තැනැත්තකු පත් කිරීම සභාවේ නිර්දේශය මත හැර, නොකරනු ලැබිය යුත්තේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන, එකී යම් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස වැඩ බැලීම සඳහා පත් කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද අදාළ විය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් ලෙස හෝ සාමාජිකයන් ලෙස පත් කිරීම සඳහා අවස්ථාව එළඹෙන කවර හෝ විටක එසේ පත් කරනු ලැබිය යුතු නිසි සහ යෝග්‍ය තැනැත්තන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම සභාවේ කාර්යයක් වන අතර ඒ නිර්දේශ වලින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළුව ශ්‍රී ලංකීය සමාජයේ බහුත්ත්ව ස්වභාවය පිළිබිඹු වන බව වගබල ගැනීමට ප්‍රයත්න දරනු ලැබිය යුත්තේ ය. ඒ කොමිෂන් සභාවල සභාපතිවරුන් සම්බන්ධයෙන් වන විට, පත් කිරීම සඳහා සභාව විසින් තැනැත්තන් තිදෙනෙකු නිර්දේශ කරනු ලැබිය යුතු අතර, නිර්දේශ කරනු ලැබූ තැනැත්තන්ගෙන් එක් අයෙකු ජනාධිපතිවරයා විසින් සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය.

(4) පත් කිරීම් සඳහා සභාවේ නිර්දේශය ලැබුණු දින සිට දින දහහතරක් ඇතුළත ජනාධිපතිවරයා විසින්, මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් සහ සාමාජිකයන් පත් කරනු ලැබිය යුත්තේ ය.

එකී දින දහහතරක කාල පරිච්ඡේදය තුළ අවශ්‍ය පත් කිරීම් කිරීමට ජනාධිපතිවරයා අපොහොසත් වූ විටක, එකී කාල පරිච්ඡේදය අවසන් වන දින සිට බල පැවැත්වෙන පරිදි :

(අ) කොමිෂන් සභාවක සාමාජිකයන් ලෙස පත් කරනු ලැබිය යුතු බවට (3) වන අනුව්‍යවස්ථාව යටතේ නිර්දේශ කරනු ලැබූ තැනැත්තන්

කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුත්තේ ය; සහ

(ආ) කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස පත්කරනු ලැබිය යුතු බවට (3) වන අනුව්‍යවස්ථාව යටතේ නිර්දේශ කරනු ලැබූ නම් සඳහන් ලැයිස්තුවේ පළමුව නම දැක්වෙන තැනැත්තා අදාළ කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් පත්කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන යම් තැනැත්තකු හෝ කොමිෂන් සභාවක සභාපතිවරයාගේ හෝ සාමාජිකයකුගේ වැඩ බැලීම සඳහා පත් කරනු ලබන තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවල සලසා තිබෙන පරිදි හැර ඉවත් කරනු නොලැබිය යුත්තේ ය. එවැනි විධිවිධානයක් නොමැති අවස්ථාවක දී ඒ තැනැත්තා සභාවේ පූර්ව අනුමතය ඇතිව පමණක් ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

(6) මැතිවරණ කොමිෂන් සභාව හැර මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් අන් සියලු කොමිෂන් සභා පාර්ලිමේන්තුවට වගකිව යුතු අතර පාර්ලිමේන්තුවට පිළිතුරු දීමට බැඳී සිටිය යුත්තේ ය.

උපලේඛනය

(අ) මැතිවරණ කොමිෂන් සභාව;

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව;

(ඇ) ජාතික පොලිස් කොමිෂන් සභාව;

(ඈ) විගණන සේවා කොමිෂන් සභාව;

(ඉ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව;

(ඊ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව;

(උ) මුදල් කොමිෂන් සභාව;

(ඌ) සීමා නිර්ණය කොමිෂන් සභාව;

(එ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව;

(ඒ) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව; සහ

(ඔ) කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව.

පත්කිරීම් සභාව විසින් අනුමත කළ යුතු බව

41 ඇ. (1) ජනාධිපතිවරයා විසින් සභාවට කරන ලද නිර්දේශයක් මත, සභාව විසින් අනුමත කර ඇත්නම් මිස, මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කිසිම ධුරයකට ජනාධිපතිවරයා විසින් කිසිදු තැනැත්තකු පත් කරනු නොලැබිය යුත්තේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන, මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් ධුරයක දින දාහතරකට වැඩි කාලයක් වැඩ බැලීම සඳහා පත් කරනු ලබන යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද අදාළ විය යුත්තේ ය:

තව ද, ජනාධිපතිවරයාගේ නිර්දේශයක් මත සභාව විසින් එවැනි වැඩබල පත්කිරීමක් අනුමත කර ඇත්නම් මිස, මුළු කාලය දින දාහතරක් ඉක්මවන වන අඛණ්ඩ වැඩබලන පත්කිරීම් එවැනි කිසිදු ධුරයක් සම්බන්ධයෙන් සිදු නොකළ යුතු ය.

(3) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කවර හෝ ධුරයකට පත් කරනු ලැබූ කිසිදු

තැනැත්තකු හෝ ඒ ධුරයකට පත් කරන ලද තැනැත්තකු වෙනුවෙන් වැඩ බැලීම සඳහා පත් කරනු ලැබූ කිසිදු තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් ලිඛිත නීතියකින් හෝ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, එකී ධුරයෙන් ඉවත් කරනු නොලැබිය යුත්තේ ය.

(4) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් සහ අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් පත්කිරීම් හා සම්බන්ධ කර්තව්‍ය ඉටු කිරීමේ දී, සභාව විසින් අග්‍රවිනිශ්චයකාරවරයාගේ අදහස් ලබාගත යුතු ය.

උපලේඛනය

I වන කොටස

(අ) අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්;

(ආ) අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්;

(ඇ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා හැර අනෙකුත් සාමාජිකයන්.

II කොටස

(අ) නීතිපතිවරයා;

(ආ) විගණකාධිපතිවරයා;

(ඇ) පොලිස්පතිවරයා;

(ඈ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්);

(ඉ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා;

(ඊ) ශ්‍රී ලංකා මහා බැංකුවේ අධිපති; සහ

(උ) සභාපති සහ මුදල් අමාත්‍යාංශය භාර අමාත්‍යවරයාගේ ලේකම් හැර, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ සාමාජිකයින්.

සභාවේ මහ ලේකම්වරයා සහ අනෙකුත් නිලධරයන්

41ඈ. (1) සභාවට මහ ලේකම්වරයකු සිටිය යුත්තේ ය. මහ ලේකම්වරයා සභාව විසින් අවුරුදු පහක කාලයක් සඳහා පත් කරනු ලැබිය යුත්තේ ය. මහලේකම්වරයා ඔහුගේ ධුර කාලය අවසන් වීමෙන් පසු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුත්තේ ය.

(2) එහි කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සභාව විසින් සළකනු ලබන යම් නිලධරයන්, සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු නියමයන් සහ කොන්දේසි මත සභාව විසින් පත් කරනු ලැබිය හැක්කේ ය.

සභාවේ රැස්වීම්

41ඉ. (1) සභාව විසින් සෑම මාසයකම යටත් පිරිසෙයින් දෙවාරයක් ද, එය වෙත මේ පරිච්ඡේදයේ විධිවිධාන මගින් හෝ වෙනත් යම් නීතියක් මගින් හෝ පවරා ඇති කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකිතාක් වාර ගණනක් ද රැස්විය යුතු අතර, සභාවේ සභාපතිවරයාගේ විධානය මත සභාවේ මහ ලේකම්වරයා විසින් ඒ රැස්වීම් කැඳවනු ලැබිය යුත්තේ ය.

(2) සභාපතිවරයා, සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුත්තේ ය. සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක දී අග්‍රාමාත්‍යවරයා ද, අග්‍රාමාත්‍යවරයා පැමිණ නොමැති අවස්ථාවක දී විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් ද සභාවේ රැස්වීම්වල මූලාසනය දැරිය යුත්තේ ය.

(3) සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත විය යුත්තේ ය.

(4) සභාව විසින් කරනු ලැබිය යුතු සෑම නිර්දේශයක් හෝ අනුමත කිරීමක් ද ගනු ලබන සෑම

තීරණයක් ඒකමතිකව තීරණය කිරීමට සභාව විසින් උත්සාහ දරනු ලැබිය යුත්තේ ය. ඒකමතික තීරණයක් නොමැති අවස්ථාවක දී සභාවේ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් පස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් සනාථ කළහොත් මිස, සභාව විසින් කරන ලද යම් නිර්දේශයක් හෝ අනුමත කිරීමක් හෝ ගනු ලැබූ යම් තීරණයක් හෝ බල සහිත නොවිය යුත්තේ ය.

(5) සභාපතිවරයාට හෝ රැස්වීමේ මුලාසනය දරන වෙනත් සාමාජිකයාට මුල් ඡන්දයක් නොමැති නමුත් සභාවේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු යම් ප්‍රශ්නයක් සඳහා සම සමව ඡන්දය ලැබුණු අවස්ථාවකදී සභාපතිවරයාට හෝ රැස්වීමේ මූලාසනය දරන වෙනත් සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුත්තේ ය.

(6) 41ආ හෝ 41ඇ ව්‍යවස්ථා යටතේ යම් පත්කිරීමක් සඳහා යෝග්‍ය තැනැත්තන් නිර්දේශ කිරීමේදී හෝ අනුමත කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ද ඇතුළුව සභාවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කරන ආකාරය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සභාව විසින් තීරණය කරනු ලැබිය යුත්තේ ය.

(7) 41අ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඈ) හෝ (ඉ) ඡේද යටතේ පත් කරනු ලැබූ සභාවේ යම් සාමාජිකයකු සභාවේ පූර්ව අවසරය ලබා නොගෙන සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණ සිටි අවස්ථාවක දී ඒ සාමාජිකයා ඒ තෙවන රැස්වීමේ දින සිට බලාත්මක වන පරිදි ධුරය අත්හරිනු ලැබූවක් සේ සැලකිය යුත්තේ ය.

(8) සභාව පූර්ණ වශයෙන් සංස්ථාපිත නොවූවද, සභාවේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් තිබුණ ද, ඒ බව නොතකා ක්‍රියා කිරීමට සභාවට බලය ඇති අතර, සභාව පූර්ණ වශයෙන් සංස්ථාපිත නොවීමේ හේතුව හෝ සභාවේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් තිබීමේ

හේතුව හෝ නිසාම පමණක් සභාවේ යම් ක්‍රියාවක්, කෘත්‍යයක් හෝ තීරණයක් අවලංගු නොවන්නේය. අවලංගු වන ලෙස නොසැලකිය යුත්තේ ය.

සභාවේ සාමාජිකයන් තවදුරටත් ධුර දැරීම

41ඊ. සභාවේ සාමාජිකයන්ගේ හෝ 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් කොමිෂන් සභාවක සාමාජිකයන්ගේ හෝ ධුර කාල ඉකුත්වීම නොතකා අවස්ථාවෝචිත පරිදි සභාවේ හෝ ඒ වෙනත් කොමිෂන් සභාවල හෝ අලුත් සාමාජිකයන් ධුර භාරගන්නා තෙක් ඒ දක්වා සිටි සභාවේ හෝ ඒ වෙනත් කොමිෂන් සභාවල සාමාජිකයෝ තවදුරටත් ධුර දැරිය යුත්තාහ.

සභාවේ බලතල හා කාර්ය

41 උ. (1) සභාව විසින් සෑම මාස තුනකට වරක් ඊට පෙරාතුව වූ මාස තුන තුළ එහි කටයුතු පිළිබඳව වාර්තාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් පනවනු ලැබිය හැකි පරිදි වූ හෝ පවරනු ලැබිය හැකි පරිදි වූ වෙනත් කාර්ය සහ කර්තව්‍ය සභාව විසින් ක්‍රියාත්මක කිරීම ද, ඉටු කිරීම ද කරනු ලැබිය යුත්තේ ය.

(3) 41 ආ හෝ 41 ඇ ව්‍යවස්ථා යටතේ ඕනෑම පත්වීමක් සඳහා සුදුසු පුද්ගලයින්ගේ නිර්දේශය හෝ අනුමැතිය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි ඇතුළුව, ස්වකීය කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීමට අදාළව රීති සෑදීමට සභාවට බලය ඇත්තේ ය. එකී සියලු රීති *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, එකී පළ කිරීමෙන් මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේ ය.

සභාවේ වියදම් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුතු බව

41ඌ. සභාව විසින් දරනු ලබන වියදම් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුත්තේ ය.

සභාවේ තීරණවල අවසානාත්මක භාවය

41එ. 126 වන ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව, සභාව විසින් එළඹෙන ලද යම් තීරණයක් හෝ කරන ලද යම් අනුමත කිරීමක් හෝ නිර්දේශයක් භාර ගැනීමට, විභාග කිරීමට, ඒ පිළිබඳ තීරණයක් දීමට හෝ කවර වූ හේතුවක් මත හෝ කවර වූ හෝ අන්‍යාකාරයකින් ප්‍රශ්න කිරීමට, කිසිදු අධිකරණයකට බලය හෝ අධිකරණ බලය නොමැති විය යුත්තේ ය. එකී තීරණය, අනුමතය හෝ නිර්දේශය සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුත්තේ ය.''

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIII පරිච්ඡේදය සංශෝධනය කිරීම

**15.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIII වන පරිච්ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන පරිච්ඡේදය ආදේශ කරනු ලැබේ:-

''VIII වන පරිච්ඡේදය

**විධායකය**

අමාත්‍ය මණ්ඩලය

අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩලය

42. (1) ජනරජයේ ආණ්ඩුවේ පාලනය මෙහෙයවීම සහ ඒ පාලනය පිළිබඳ විධානය භාර අමාත්‍ය මණ්ඩලයක් වන්නේ ය.

(2) අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුවට සාමූහිකව වගකීමට සහ පිළිතුරු බැඳීමට බැඳී සිටින්නේ ය.

(3) අග්‍රාමාත්‍යවරයා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානයා වන්නේ ය.

(4) පාර්ලිමේන්තුවේ විශ්වාසය උපරිම වශයෙන් ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය.

(5) පාර්ලිමේන්තුව විසින් නීතියෙන් හෝ ස්ථාවර නියෝග මගින් සලසා ඇති ක්‍රියා පටිපාටියට අනුකූලව, කථානායකවරයා තෝරා පත්කර ගත් වහාම, එහි පළමු රැස්වීමේදී, අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරන ලද මන්ත්‍රීවරයා තුළ විශ්වාසය පිළිබඳ යෝජනාවක් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කළ යුතු ය:

එසේ වුව ද, පැමිණ සිටින සහ ඡන්දය ප්‍රකාශ කරන මන්ත්‍රීවරුන්ගෙන් බහුතරයකින් විශ්වාස පිළිබඳ යෝජනාව සම්මත නොවන්නේ නම්, ඒ වන විට අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කර ඇති මන්ත්‍රීවරයා අග්‍රාමාත්‍ය ධුර දැරීම නතර වන අතර, පාර්ලිමේන්තුව, පාර්ලිමේන්තුව විසින් නීතියෙන් හෝ ස්ථාවර නියෝග මගින් සලසා ඇති ක්‍රියා පටිපාටියට අනුකූලව එහි මන්ත්‍රීවරයකු අගමැති ලෙස තෝරාපත් කර ගත යුතු ය.

(6) මෙම ව්‍යවස්ථාවේ (5) අනුව්‍යවස්ථාව ප්‍රකාරව මන්ත්‍රීවරයකු අගමැති ලෙස තේරී පත් වුවහොත්, එම මන්ත්‍රීවරයා ජනාධිපතිවරයා ඉදිරියේ වහාම දිවුරුම් දිය යුතු අතර, ජනාධිපතිවරයා එම මන්ත්‍රීවරයාට එසේ දින දෙකක් ඇතුළත අග්‍රාමාත්‍යවරයා ලෙස දිවුරුම් දීමට අවස්ථාවක් නොදුනහොත්, එම දින දෙකක කාලසීමාව අවසානයේ දී, අග්‍රාමාත්‍යවරයා ලෙස දිවුරුම් දුන් බව සලකනු ලැබිය යුත්තේ ය.

(7) ජනාධිපතිවරයා විසින් පත් කරන ලද හෝ අග්‍රාමාත්‍යවරයා ලෙස දිවුරුම් දුන් බව සලකනු ලබන අග්‍රාමාත්‍යවරයා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව ධුරය දැරීම නවත්වන්නේ නම් මිස, ඊළඟ මහ මැතිවරණයට පසුව අග්‍රාමාත්‍යවරයකු පත් කරන තෙක් ධුරයේ කටයුතු කළ යුතු ය.

අමාත්‍යවරයන් සහ ඔවුන්ගේ විෂය සහ කාර්ය

43. (1) අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත, ජනාධිපතිවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාව ද අමාත්‍යාංශ සංඛ්‍යාව ද, එකී අමාත්‍යාංශවලට පවරන විෂය සහ කාර්ය ද නිශ්චය කළ යුත්තේ ය.

(2) එසේ නිශ්චය කරනු ලබන අමාත්‍යාංශ භාරව කටයුතු කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතුරෙන් අමාත්‍යවරයන් පත් කළ යුත්තේ ය.

(3) ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත, අමාත්‍ය මණ්ඩලය වෙත පවරන ලද විෂය සහ කාර්ය වෙනස් කිරීම සහ අමාත්‍ය මණ්ඩලයේ සංයුතිය වෙනස් කිරීම ද කරනු ලැබිය යුත්තේ ය. අමාත්‍ය මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට සහ පාර්ලිමේන්තුව වෙත අමාත්‍ය මණ්ඩලය දරන වගකීමේ අඛණ්ඩ පැවැත්මට එවැනි වෙනස් කිරීමක් බල නොපාන්නේ ය.

**අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්**

44. (1) ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන් අතුරෙන් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් පත් කරනු ලැබිය යුත්තේ ය.

(2) අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත, ජනාධිපතිවරයා විසින් මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන අමාත්‍යවරයන්ට පැවරිය යුතු විෂය සහ කාර්ය ද ඔවුන්ට යම් අමාත්‍යාංශ භාර කරන්නේ නම් ඒ අමාත්‍යාංශ ද නිශ්චය කරනු ද ලැබිය යුත්තේ ය.

(3) අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත, ජනාධිපතිවරයා විසින්, මේ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව යටතේ කරන යම් භාර කිරීමක් වෙනස් කරනු ලැබිය යුත්තේ ය.

(4) (1) වන අනුව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන සෑම අමාත්‍යවරයෙක්ම අමාත්‍ය මණ්ඩලයට සහ පාර්ලිමේන්තුවට වගකීමට බැඳී සිටින්නේ ය.

(5) අමාත්‍ය මණ්ඩලයේ කවර වූ හෝ අමාත්‍යවරයකු විසින් ඔහු වෙත පැවරී ඇති යම් විෂයයකට හෝ කාර්යයකට අදාළ යම් බලතල කිසිවක් හෝ කාර්යයක් හෝ යම්කිසි ලිඛිත නීතියකින් ඔහු වෙත පැවරී ඇත්තා වූ හෝ නියම වී ඇත්තා වූ යම් බලතල කිසිවක් හෝ කාර්යයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින්, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකුට පවරා දිය හැකි අතර, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයාට එකී බලතල කිසිවක් හෝ කාර්යයක් පවරන්නාවූ හෝ නියම කරන්නා වූ ලිඛිත නීතියේ පටහැනිව කුමක් සඳහන් වුව ද මේ අනුව්‍යවස්ථාව ද යටතේ එකී වෙනත් අමාත්‍යවරයා වෙත පවරා දෙනු ලැබූ යම් බලතල කිසිවක් හෝ කාර්යයක් ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

**නියෝජ්‍ය අමාත්‍යවරයන්**

45. (1) ජනාධිපතිවරයා විසින්, අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ට ඔවුන්ගේ කාර්ය ඉටු කිරීමෙහිලා සහාය වීම පිණිස පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන් අතුරෙන් නියෝජ්‍ය අමාත්‍යවරයන් පත් කරනු ලැබිය යුත්තේ ය.

(2) අමාත්‍ය මණ්ඩලයේ කවර හෝ අමාත්‍යවරයකු විසින්, ඔහු වෙත පවරා ඇති යම් විෂයයකට හෝ කාර්යයකට අදාළ යම් බලයක් හෝ කාර්යයක් හෝ යම්කිසි ලිඛිත නීතියකින් ඔහු වෙත පැවරී ඇත්තා වූ හෝ නියම කරනු ලැබ ඇත්තා වූ බලතල කිසිවක් හෝ කාර්යයක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් තම නියෝජ්‍ය අමාත්‍යවරයාට පවරා දිය හැකි අතර, එකී අමාත්‍යවරයාට එකී බලය හෝ කාර්යය පවරන්නා වූ හෝ නියම කරන්නා වූ ලිඛිත නීතියේ පටහැනිව කුමක් සඳහන් වී තිබුණ ද එකී නියෝජ්‍ය අමාත්‍යවරයා විසින්, එසේ පවරා දෙනු ලැබූ යම් බලයක් හෝ කාර්යයක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

අග්‍රාමාත්‍යවරයාගේ ධුර කාලය සහ අමාත්‍යවරයන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාව සහ ධුර කාලය සීමා කිරීම

46. (1) (අ) අමාත්‍ය මණ්ඩලයේ මුළු අමාත්‍යවරයන් සංඛ්‍යාව විසි පහක් නොඉක්ම විය යුතුය; සහ

(ආ) අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාවේ එකතුව විසි පහක් නොඉක්ම විය යුතුය.

(2) අග්‍රාමාත්‍යවරයා -

(අ) ස්වකීය අත්සන යටතේ ජනාධිපතිවරයා වෙත යවන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත්; හෝ

(ආ) තවදුරටත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නොවුවහොත්,

මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම් තාක් කල් අමාත්‍ය මණ්ඩලය පවත්නේ ද ඒ තාක් කල් ස්වකීය ධුරය දරන්නේ ය.

(3) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙක්, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයෙක් හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙක්-

(අ) අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත ජනාධිපතිවරයාගේ අත්සන යටතේ යවනු ලබන ලිපියක් මගින් ඉවත් කරනු ලැබුව හොත්; හෝ

(ආ) ස්වකීය අත්සන යටතේ ජනාධිපතිවරයා වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත්; හෝ

(ඇ) තවදුරටත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු නොවුවහොත්; හෝ

(ඈ) මෙම ව්‍යවස්ථාවේ (4) අනුව්‍යවස්ථාව අනුව ඉවත් කර ඇති නම්,

මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම්තාක් කල් අමාත්‍ය මණ්ඩලය පවතින්නේ ද, ඒ තාක් කල් ස්වකීය ධුරය දරන්නේ ය.

(4) අමාත්‍ය මණ්ඩලයේ කිසියම් අමාත්‍යවරයෙකුට, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයෙකුට, හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකුට එරෙහිව පාර්ලිමේන්තුව විශ්වාසභංග යෝජනාවක් සම්මත කරන්නේ නම්, එම විශ්වාසභංග යෝජනාව සම්මත කිරීම සමගම එම අමාත්‍යවරයා එම ධුරයෙන් ඉවත් කර ඇති පුද්ගලයෙක් ලෙස සැලකිය යුත්තේ ය.

පාර්ලිමේන්තුව විසුරුවා ඇති කාලය තුළ අමාත්‍ය මණ්ඩලය

47. (1) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලබන තෙක් ක්‍රියා කළ අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, දිගටම ක්‍රියා කළ යුතු අතර මහ මැතිවරණය අවසාන වූ විට, එසේ ක්‍රියා කිරීම නතර කළ යුත්තේ ය. ඒ අනුව අග්‍රාමාත්‍යවරයා ද අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෝ ද 46 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයේ සහ (3) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ විධිවිධාන සලසා ඇති පරිදි ධුර දැරීම නතර වුවහොත් මිස, දිගටම ක්‍රියා කළ යුතු අතර, එසේ ධුර දැරීමේ දී

ඔවුන් විසින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන නිර්ණායකයන් පිළිපදිමින් මැතිවරණයට අයුතු ලෙස බලපෑමක් නොවන පරිද්දෙන් ක්‍රියා කළ යුත්තේ ය.

(2) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත් මහ මැතිවරණය අවසාන වීමත් අතර කාලය තුළ අග්‍රාමාත්‍යවරයා මිය ගියේ වුව ද, අස්වූයේ වුව ද, අමාත්‍ය මණ්ඩලය, අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් අමාත්‍යවරයන්ගෙන් සමන්විතව මහ මැතිවරණය අවසාන වන තෙක් ක්‍රියා කළ යුත්තේ ය. තවද අග්‍රාමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා ඉටු කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් එකී අමාත්‍යවරයන් අතුරෙන් යම් අමාත්‍යවරයකු පත් කරනු ලැබිය හැක්කේ ය.

(3) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත් මහ මැතිවරණය අවසාන වීමත් අතර කාලය තුළ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු මිය ගියවිට හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට හෝ ඉල්ලා අස් වූ විට ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය භාරව කටයුතු කිරීම හෝ ඒ අමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හා ඉටු කිරීමට වෙනත් කවර වූ හෝ අමාත්‍යවරයකු ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත පත් කරනු ලැබිය හැක්කේ ය.

අමාත්‍ය මණ්ඩලය විසිරීම

48. (1) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත් මහ මැතිවරණය අවසාන වීමත් අතර කාලය තුළ හැර, මිය යාමෙන්, ධුරයෙන් ඉල්ලා අස්වීමෙන් හෝ අමාත්‍ය මණ්ඩලය විසුරුවා හැරීම හේතුවෙන්, අග්‍රාමාත්‍යවරයා ධුරය දැරීම නතර වූ විට, අමාත්‍ය මණ්ඩලය විසිරෙන්නේය. එසේ වූ විට ජනාධිපතිවරයා විසින් 42 වන, 43 වන, 44 වන සහ 45 වන ව්‍යවස්ථා අනුව අග්‍රාමාත්‍යවරයකු ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් ද, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් ද, නියෝජ්‍ය අමාත්‍යවරයන් ද පත් කළ යුත්තේ යඃ

එසේ වුව ද, ඉහත කී පරිදි අග්‍රාමාත්‍යවරයා ධුරය දැරීම නතර වීමෙන් පසුව පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුවහොත්, අමාත්‍ය මණ්ඩලය, අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් අමාත්‍යවරයන්ගෙන් සමන්විතව මහ මැතිවරණය අවසාන වන තෙක් ක්‍රියා කළ යුත්තේ ය. තව ද අග්‍රාමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉටු කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් එකී අමාත්‍යවරයන් අතුරෙන් යම් අමාත්‍යවරයකු පත් කරනු ලැබිය හැක්කේ ය. තවද, 47 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ සම්බන්ධයෙන් අදාළ වන්නේ යː

එසේ වුව ද, එවැනි විසුරුවා හැරීමක දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42 වන ව්‍යවස්ථාවේ (4) - (7) අනුව්‍යවස්ථාවල විධිවිධාන ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි, එසේ විසුරුවා හැරීම නොතකා, ජනාධිපතිවරයා විසින් වහාම පාර්ලිමේන්තුව කැඳවිය යුතු ය.

(2) පාර්ලිමේන්තුව විසින් විසර්ජන පනත් කෙටුම්පත ප්‍රතික්ෂේප කළහොත් එවිට ද ආණ්ඩුව කෙරෙහි විශ්වාසභංග යෝජනාවක් සම්මත කළහොත් එවිට ද අමාත්‍ය මණ්ඩලය විසිරෙන්නේය. එසේ වූ විට 70 වන ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කරමින් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුවහොත් මිස, ජනාධිපතිවරයා විසින් 42 වන, 43 වන, 44 වන සහ 45 වන ව්‍යවස්ථා අනුව අග්‍රාමාත්‍යවරයෙක් ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ද, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් ද, නියෝජ්‍ය අමාත්‍යවරයන්ද පත් කළ යුත්තේ යː

එසේ වුවද, මෙම ව්‍යවස්ථාවේ කාර්යය සඳහා, පාර්ලිමේන්තුවේ පළමු රැස්වීමේ සිට පළමු වසර දෙක තුළ, විසර්ජන පනත් කෙටුම්පත අවස්ථා දෙකකදී පාර්ලිමේන්තුවේ දී පරාජයට පත් වුවහොත් පමණක් එය ප්‍රතික්ෂේප වූවා සේ සලකනු ලැබේː

තව ද, එවැනි අවස්ථාවක 70 වන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා විසින් තම බලතල ක්‍රියාත්මක කර පාර්ලිමේන්තුව විසරුවා හරිනු ලැබුහොත්, ආණ්ඩුකම ව්‍යවස්ථාවේ 42 වන ව්‍යවස්ථාවේ (4)-(7) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා, එසේ විසුරුවා හැරීම නොතකා, ඔහු වහාම පාර්ලිමේන්තුව කැඳවිය යුතුය. ඒ අනුව 42, 43, 44 සහ 45 ව්‍යවස්ථා ප්‍රකාරව අගමැතිවරයෙකු, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් පත් කළ  යුතු ය.

වැඩ බලන අමාත්‍යවරයන් සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්

49. අමාත්‍ය මණ්ඩලයේ යම්කිසි අමාත්‍යවරයකුට අමාත්‍යවරයන් සහ නියෝජ්‍ය අමාත්‍යවරයන් හෝ අමාත්‍ය මණ්ඩලයේ සමාජිකයෙකු නොවන අමාත්‍යවරයකුට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකුට හෝ ඔහුගේ ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වුවහොත් එවිට එකී අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයාගේ හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයාගේ හෝ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ධුරයේ වැඩ බැලීම සඳහා ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත පාර්ලිමේන්තුවේ කවර වූ හෝ මන්ත්‍රීවරයකු පත් කිරීම කළ හැකි වන්නේ ය.

අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා

50. (1) අමාත්‍ය මණ්ඩලයට ජනාධිපතිවරයා විසින්, අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත, පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් වන්නේ ය.

(2) අග්‍රාමාත්‍යවරයාගේ විධානයන්ට යටත්ව අමාත්‍ය මණ්ඩලයේ කාර්යාලය භාරව කටයුතු කිරීමත් අග්‍රාමාත්‍යවරයා විසින් හෝ අමාත්‍ය මණ්ඩලය විසින් හෝ ඔහුට පවරනු ලබන්නා වූ වෙනත් යම් කර්තව්‍ය හෝ කාර්ය ඉටු කිරීමක් ලේකම්වරයා විසින් කරනු ලැබිය යුත්තේ ය.

අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයා

51. (1) අග්‍රාමාත්‍යවරයාට, ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත, පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් වන්නේ ය.

(2) අග්‍රාමාත්‍යවරයාගේ කාර්යාලය භාරව කටයුතු කිරීමත් අග්‍රමාත්‍යවරයාගේ විධානයන්ට යටත්ව ඔහුගේ ධුරයේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම හා කිරීමත් ලේකම්වරයා විසින් කළ යුත්තේ ය.

අමාත්‍යාංශයන්හි ලේකම්වරයන්

52. (1) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකුගේ සෑම අමාත්‍යාංශයක්ම සඳහා ජනාධිපතිවරයා විසින්, අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත, පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් වන්නේ ය.

(2) අමාත්‍යාංශයක ලේකම්වරයා ඔහුගේ අමාත්‍යවරයා භාරයේ දෙපාර්තමේන්තු ද වෙනත් ආයතන ද අමාත්‍යවරයාගේ විධානයට හා පාලනයට යටත්ව මෙහෙයවන්නේ ය.

(3) අමාත්‍යාංශයක ලේකම්වරයා ධුරය දැරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ අමාත්‍ය මණ්ඩලය විසිර ගිය විට හෝ ඒ අමාත්‍යාංශයේ පැවැත්ම නතරවීමේ ප්‍රතිඵලය ඇති තීරණයක් 43 වන ව්‍යවස්ථාව හෝ 44 වන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා විසින් කරනු ලැබූ විටක හෝ නතර විය යුත්තේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ කාර්ය සඳහා ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ ධුරය, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ ධුරය, විගණකාධිපතිවරයාගේ ධුරය, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ (ඔම්බුඩ්ස්මන්) ධුරය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ ධුරය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු ලෙස නොසැලකිය යුත්තේය.

නිල ප්‍රතිඥාව සහ දිවුරුම

53. මේ පරිච්ඡේදයේ දැක්වෙන යම් කිසි ධුරයකට පත් කරනු ලැබූ සෑම තැනැත්තකුම ඔහු හතරවන උපලේඛනයේ සහ හත්වන උපලේඛනයේ දැක්වෙන ප්‍රතිඥාව දී ඊට අත්සන් තබන්නේ නම් මිස හෝ දිවුරුම් දී ඊට අත්සන් තබන්නේ නම් මිස, ස්වකීය ධුරයට අයත් කාර්යන් හි නොයෙදිය යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**16.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 වන ව්‍යවස්ථාව පහත දක්වා ඇති පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එකී ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

"(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත (මේ පරිච්ඡේදයෙහි "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් විය යුත්තේය. ඒ සාමාජිකයන් අතුරෙන් සාමාජිකයන් තිදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයන් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන් විය යුත්තාහ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයකු එහි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේය.";

(2) එකී ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

"(4) කොමිෂන් සභාවේ සාමාජිකයකු මේ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව යටතේ නුසුදුසු වීමකට පාත්‍ර වුවහොත් හෝ ජනාධිපතිවරයා අමතා යවන ලියවිල්ලක් මඟින්, නියමිත දිනට පෙරාතුව ධුරයෙන් ඉල්ලා අස් වුවහොත් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ඇතිව ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධව අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු ප්‍රජා අශක්නුතාවන්ට යටත් කළ යුතු බවට යෝජනා සම්මතයක් 81 වන ව්‍යවස්ථාව යටතේ සම්මත කොට ඇත්නම් හෝ මේ ව්‍යවස්ථාවේ (6) වන අනුව්‍යවස්ථාව යටතේ ධුරය හැර යන සේ සලකනු ලැබුවහොත් හෝ මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුර දැරිය යුත්තේ ය."; සහ

(3) එකී ව්‍යවස්ථාවේ (7) වන අනුව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :-

"(7) ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සමාජිකයකුට මාස දෙකක් නොඉක්මවන කාලයකට කොමිෂන් සභාවට අදාළ කාර්ය වලින් නිවාඩු දෙනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වීමට සුදුසුකම් ඇති තැනැත්තකු, ඒ නිවාඩු කාලය සඳහා තාවකාලික සාමාජිකයෙකු වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත පත් කරනු ලැබිය යුත්තේය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ඉ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**17.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ඉ වන ව්‍යවස්ථාවේ (ආ) අනුව්‍යවස්ථාවේ "41අ වගන්තිය" යන වචන ඉවත් කර ඒ වෙනුවට "41ඇ ව්‍යවස්ථාව යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය කෙරේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**18.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වන ව්‍යවස්ථාව මෙයින් පහත පරිදි සංශෝධනය කෙරේ:-

(අ) එහි (1) අනුව්‍යවස්ථාවේ "41අ ව්‍යස්ථාව" යන වචන ඉවත් කර "41ඇ ව්‍යවස්ථාව" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එහි (5) අනුව්‍යවස්ථාවේ (ඇ) අයිතමයේ "ජනාධිපතිවරයා විසින්" යන වචනවලට පසුව "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත" යන වචන එකතු කිරීමෙන්;

(ඇ) එහි (6) අනුව්‍යවස්ථාවේ "වෙනුවෙන්" යන වචනයට පසුව "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව", යන වචන එකතු කිරීම මගින්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**19.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාව පහත පරිදි සංශෝධනය කෙරේ :-

(අ) එහි (1) අනුව්‍යවස්ථාවේ අතුරු විධානයේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත ඡේදය ආදේශ කිරීම මගින් :-

"(අ) පාර්ලිමේන්තුව විසින්, (නොපැමිණි මන්ත්‍රීවරුන්ද ඇතුළුව) මුළු මන්ත්‍රීවරුන් සංඛ්‍යාවෙන් අඩකට නොඅඩු සංඛ්‍යාවක් අනුමත කරනු ලබන යෝජනා සම්මතයක් මගින්, පාර්ලිමේන්තුව විසුරුවා හරින ලෙස ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කරනු ලබන්නේ නම් මිස, පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නොකළ යුත්තේය.".

(ආ) එහි (1) අනුව්‍යවස්ථාවේ අතුරු විධානයේ (ඇ) ඡේදය ඉවත් කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**20.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යස්ථාව ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) සෑම පනත් කෙටුම්පතක් ම පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට යටත් පිරිසෙයින් දවස් දහහතරකට පෙර ගැසට් පත්‍රයේ පළ කළ යුත්තේය.".

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම**

**21.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවට ඉක්බිතිව පහත දැක්වෙන අතුරු විධානය ඇතුළත් කිරීම මගින් 80 වන ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"එසේ වුව ද, (අ) ඡේදයේ දක්වා ඇති කාලසීමාව අවසන් වී දින දහහතරක් ඇතුළත පනත් කෙටුම්පත සහතික කිරීමට ජනාධිපතිවරයා අපොහොසත් වුවහොත් හෝ, ජනමත විචාරණයේ වලංගුභාවය අභියෝගයට ලක් කරමින් පෙත්සමක් ගොනු කිරීමෙන් අනතුරුව ජනමත විචාරණය වලංගු බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළහොත්, එදින සිට දින දාහතරක් ඇතුළත පනත් කෙටුම්පත සහතික කිරීමට ජනාධිපතිවරයා අපොහොසත් වුවහොත්, එකී දින දාහහතරක කාලසීමාව අවසන් වූ පසු පනත් කෙටුම්පත සහතික කළ බව සලකනු ලැබේ.".

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම**

**22.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85 වන ව්‍යවස්ථාව පහත පරිදි සංශෝධනය කෙරේ :-

(අ) එහි (1) අනුව්‍යවස්ථාවට ඉක්බිතිව පහත අතුරු විධානය එකතු කිරීම මගින්:

"එසේ වුව ද, පාර්ලිමේන්තුවේදී ඊට පක්ෂව මුළු මන්ත්‍රීවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක් (නොපැමිණෙන අය ඇතුළුව) ඡන්දය දී දින 28ක් ඇතුළත එවැනි පනත් කෙටුම්පතක් හෝ එහි විධිවිධාන ජනමත විචාරණයකින් ජනතාවට ඉදිරිපත් කිරීමට ජනාධිපතිවරයා අපොහොසත් වුවහොත්, එවැනි පනත් කෙටුම්පතක් හෝ විධිවිධානයක්, ජනමතවිචාරණයකට යොමු කළ සේ සලකනු ලබන අතර, මැතිවරණ කොමිෂන් සභාව ඒ අනුව කටයුතු කළ යුතුය.".

(ආ) එම ව්‍යවස්ථාවේ (2) අනුව්‍යවස්ථාව ඉවත් කිරීම මගින්.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 88 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම**

**23.** 88 ව්‍යවස්ථාවේ "ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමේ දී සහ" යන වචන ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**24.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාවේ "ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම හෝ" හෝ ජනාධිපතිවරයා තෝරා පත්කිරීමේ ඡන්ද විමසීමකදී හෝ" දැක්වෙන සෑම අවස්ථාවකම එම වචන ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**25.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 වන ව්‍යවස්ථාවේ (ඈ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එම ඡේදයේ (iv) අයිතමය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීමෙන්:-

"(iv) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නොවන 41අ ව්‍යවස්ථාවේ සඳහන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයකු;

(iv-අ) 41ආ ව්‍යවස්ථාවේ සඳහන් වන කොමිෂන් සභාවක සාමාජිකයකු";

(ආ) එම ඡේදයේ (xii) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය ඇතුළත් කිරීමෙන්:-

"(xiii) වෙනත් රටක පුරවැසියකු වන ශ්‍රී ලංකාවේ පුරවැසියකු;".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**26.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 වන ව්‍යවස්ථාවේ (ඇ) ඡේදයේ "ඔහු" යන වචනයට ඉක්බිතිව ම "පාර්ලිමේන්තුව විසින් සහ/හෝ" යන වචන ඇතුළත් කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 93 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**27.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 93 වන ව්‍යවස්ථාව, "ජනරජයේ ජනාධිපතිවරයා සහ" යන වචන ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**28.** ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ 94 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 94 වන ව්‍යවස්ථාව අහෝසි කිරීම

**29.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වන ව්‍යවස්ථාවේ (2) ඡේදයේ "41අ වන ව්‍යවස්ථාවේ" යන වචන වෙනුවට "41ආ වන ව්‍යවස්ථාවේ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**30.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වන ව්‍යවස්ථාවේ පහත පරිදි සංශෝධනය කෙරේ:-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

(අ) 99 වන ව්‍යවස්ථාවේ (13) අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයේ අතුරු විධානය ඉවත් කර සහ ඒ වෙනුවට පහත නව අතුරු විධානය ආදේශ කිරීම මගින්:-

"එසේ වුව ද-

(i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු එසේ නෙරපා හරින අවස්ථාවක, එකී මාසයක කාලය ඉකුත්වීමට පෙර, ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයට ලිඛිතව පෙත්සමක් මගින් අයදුම් කරන්නේ නම්, සහ එවැනි පෙත්සමක් ගොනු කිරීමෙන් සති දෙකක් ඇතුළත, අන්තර් පාර්ශ්වීය කරුණු තහවුරු කිරීමෙන් පසුව, පළමු අවස්ථාවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය එම අයදුම්පත පවත්වාගෙන යාමට අවසර ලබාදෙන්නේ නම්, එම පුරප්පාඩුව අත්හිටුවිය යුතු ය;

(ii) ශ්‍රේෂ්ඨාධිකරණය, ඉල්ලුම්පත්‍රය සම්පූර්ණයෙන් විභාග කිරීමෙන් පසු එවැනි නෙරපා හැරීම වලංගු නොවන බව තීරණය කරන්නේ නම්, එම ආසනය පුරප්පාඩු නොවනු ඇත;

(iii) ශ්‍රේෂ්ඨාධිකරණය සිය විමර්ශනය නෙරපා හැරීම, නෙරපා හැරීමට හේතුවේ නීත්‍යානුකූලභාවයට සීමා කළ යුතු අතර, දේශපාලන පක්ෂය හෝ ස්වාධීන

කණ්ඩායම විසින් අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටිය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් කිසිදු අධිකරණ බලයක් ක්‍රියාත්මක නොකළ යුතුය;

(iv) එවැනි පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකරුවන් තිදෙනකුට නොඅඩු විනිසුරු මඩුල්ලක් විසින් විභාග කළ යුතු අතර, එම පෙත්සම ගොනු කිරීමෙන් මාස දෙකක් ඇතුළත සම්පූර්ණ නඩු විභාගය අවසන් කළ යුතු ය;

(v) නෙරපා හැරීම වලංගු බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන්නේ නම්, එම පුරප්පාඩුව එම තීරණය කළ දින සිට සිදු වූ ලෙස සැලකෙන්නේ ය;

(vi) නෙරපා හැරීමක් වලංගු නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළ අවස්ථාවක වුව ද, එවැනි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43, 44 හෝ 45 වන ව්‍යවස්ථා ප්‍රකාරව, ඔහු පාර්ලිමේන්තුවට තේරී පත් වූ දේශපාලන පක්ෂය හැර වෙනත් ඕනෑම දේශපාලන පක්ෂයක් විසින් පිහිටුවන ලද රජයක් තුළ, අමාත්‍යවරයකු ලෙස පත්වීම් භාර ගැනීමට නුසුදුස්සෙක් වන්නේය.".

(ආ) 99 ව්‍යවස්ථාවේ (14) අනුව්‍යවස්ථාව ලෙස බලාත්මක වන පහත සඳහන් නව ඡේදය එකතු කිරීම මගින්:-

"(14) මේ ව්‍යවස්ථාවේ (13) වන අනුව්‍යවස්ථාවෙන් සලසා ඇති පරිදි හැර, යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන්නා වූ තම සාමාජිකයකුට එරෙහිව ගන්නා ලද හෝ ගැනීමට යෝජිත යම් විනය ක්‍රියාවක් විභාග කොට තීරණය කිරීමට කිසිදු අධිකරණයකට අධිකරණ බලයක් නොමැති අතර, ඒ අනුව එවැනි ක්‍රියාවක් හෝ යෝජිත ක්‍රියාවක් වළක්වමින්, මැඩපවත්වමින් හෝ තහනම් කරමින් ඊට රිට් ආඥාවක් හෝ ඉන්ජන්ෂන් ආඥාවක් හෝ වාරණ ආඥාවක් ප්‍රදානය කිරීමට කිසිදු අධිකරණයකට අධිකරණ බලය නොමැත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**31.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එම ව්‍යවස්ථාවේ (1) ඡේදයේ "41අ වන ව්‍යවස්ථාවේ" යන වචන වෙනුවට, "41ආ ව්‍යවස්ථාවේ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම ව්‍යවස්ථාවේ (1) ඡේදයේ "ඔවුන් අතරින් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය." යන වචන වලට පෙරාතුව "41ආ වන ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව" යන වචන ඇතුළත් කිරීමෙන්;

(ඇ) එම ව්‍යවස්ථාවේ (7) ඡේදයේ "41අ වන ව්‍යවස්ථාවේ" යන වචන වෙනුවට "41ආ වන ව්‍යවස්ථාවේ" යන වචන ආදේශ කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**32.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ වන ව්‍යවස්ථාව එකී ව්‍යවස්ථාවේ (4අ) වන අනුව්‍යවස්ථාව ඉවත් කිරීම මඟින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ඉ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**33.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ඉ වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:

(අ) එම ව්‍යවස්ථාවේ (1) ඡේදයේ "ඒ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා" යන වචන වලට ඉක්බිතිවම "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව" යන වචන ඇතුළත් කිරීමෙන්;

(ආ) එම ව්‍යවස්ථාවේ (7) ඡේදයේ (ඇ) අනුඡේදයේ "හැට" යන වචනය වෙනුවට, "හැට පහ" යන වචන ආදේශ කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**34.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාව, එහි "41අ වන ව්‍යවස්ථාවේ" යන වචන වෙනුවට, "41ඇ වන ව්‍යවස්ථාවේ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 109 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම*

**35.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 109 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එම ව්‍යවස්ථාවේ (1) ඡේදයේ "41අ වන ව්‍යවස්ථාවේ" යන වචන වෙනුවට, "41ඇ වන ව්‍යවස්ථාවේ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම ව්‍යවස්ථාවේ (2) ඡේදයේ "41අ වන ව්‍යවස්ථාවේ" යන වචන වෙනුවට, "41ඇ වන ව්‍යවස්ථාවේ" යන වචන ආදේශ කිරීමෙන්.

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම*

**36.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ වන ව්‍යවස්ථාව, එහි (2) ඡේදයේ "ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීමක දී හෝ" යන වචන ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම*

**37.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ වන ව්‍යවස්ථාව, එහි (1) ඡේදයේ "41අ වන ව්‍යවස්ථාවේ" යන වචන වෙනුවට "41ඇ වන ව්‍යවස්ථාවේ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඉ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම*

**38.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඉ වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එම ව්‍යවස්ථාවේ (5) ඡේදයේ "41අ වන ව්‍යවස්ථාවේ" යන වචන වෙනුවට, "41ඇ වන ව්‍යවස්ථාවේ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම ව්‍යවස්ථාවේ (6) ඡේදයේ "ජනාධිපතිවරයා විසින්" යන වචන වලට ඉක්බිතිව ම "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ඇතුව" යන වචන ඇතුළත් කිරීමෙන්.

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 129 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම*

**39.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 129 වන ව්‍යවස්ථාව එකී ව්‍යවස්ථාවේ (1) සහ (4) වන අනුව්‍යවස්ථා ඉවත් කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**40.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එම ව්‍යවස්ථාවේ (1) ඡේදයේ "41අ වන ව්‍යවස්ථාවේ" යන වචන වෙනුවට, "41ඇ වන ව්‍යවස්ථාවේ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම ව්‍යවස්ථාවේ (1) ඡේදයේ "විගණකාධිපතිවරයා යථා පැවැත්මෙන් සිටින තාක් ස්වකීය ධුරය දරන්නේ ය." යන වචන ඉවත් කිරීමෙන්;

(ඇ) එම ව්‍යවස්ථාවේ (3) ඡේදයේ (ඈ) අනුඡේදයේ "ජනාධිපතිවරයා" යන වචනයට පෙරාතුව "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත" ඇතුළත් කිරීමෙන්;

(ඈ) එම ව්‍යවස්ථාවේ (4) ඡේදයේ "41අ වන ව්‍යවස්ථාවේ" යන වචන වෙනුවට, "41ඇ වන ව්‍යවස්ථාවේ" යන වචන ආදේශ කිරීමෙන්;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 අ-ඌ වන ව්‍යවස්ථාවන් ඇතුළත් කිරීම

**41.** පහත දැක්වෙන අලුත් ව්‍යවස්ථා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාවට ඉක්බිතිව ඇතුළත් කරනු ලබන අතර, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153අ, 153ආ, 153ඇ, 153ඈ, 153ඉ, 153ඊ, 153උ සහ 153ඌ යන ව්‍යවස්ථා ලෙස බල පැවැත්විය යුත්තේ ය-

"විගණන සේවා කොමිෂන් සභාවේ සංයුතිය.

153අ. (1) (මේ ඡේදයේ "කොමිෂන් සභාව" යනුවෙන් හඳුන්වනු ලබන) විගණන සේවා කොමිෂන් සභාවක් පැවතිය යුතු අතර, එකී කොමිෂන් සභාව එකී සභාවේ සභාපතිවරයා විය යුතු විගණකාධිපතිවරයාගෙන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් ද සමන්විත විය යුත්තේ ය:-

(අ) නියෝජ්‍ය විගණකාධිපති හෝ නියෝජ්‍ය විගණකාධිපතිවරයාගේ ශ්‍රේණියට ඉහළින් වූ ධුරයක් උසුලන ලද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාමලත් නිලධරයන් දෙදෙනකු;

(ආ) ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාරවරයකු; සහ

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවාවේ විශ්‍රාමලත් 1 වන පන්තියේ නිලධරයකු.

(2) (අ) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරන ලද තැනැත්තකු-

(i) ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මඟින් අස්වුවහොත්;

(ii) මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි ධුරයෙන් ඉවත් කළහොත්;

(iii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා සභිකයකු හෝ පළාත් පාලන ආයතන සභිකයකු හෝ වුවහොත්,

මිස, අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුත්තේ ය.

(ආ) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබූ තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත වැඩිදුර ධුර කාලයක් සඳහා පත් කරනු ලැබීමට සුදුස්සකු වන්නේ ය.

(3) ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ඇතිව (1) වන අනුව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබූ යම් තැනැත්තකු හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැක්කේ ය.

(4) කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයන්ට පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන දීමනාවක් ගෙවනු ලැබිය හැක්කේ ය. එම දීමනාව ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු

අතර, සභාපතිවරයාගේ හෝ සාමාජිකයන්ගේ ධුර කාලය තුළ දී එය අඩු කරනු නොලැබිය යුත්තේ ය.

(5) කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයන් දණ්ඩ නීති සංග්‍රහයේ IX වන පරිච්ඡේදය අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුත්තා හ.

(6) කොමිෂන් සභාවට, කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන ලේකම්වරයකු සිටිය යුත්තේ ය.

**කොමිෂන් සභාවේ රැස්වීම්**

153ආ. (1) කොමිෂන් සභාවේ යම් රැස්වීමක ගණපූරණය එකී සභාවේ සාමාජිකයන් තුන් දෙනකුගෙන් සමන්විත වන්නේ ය.

(2) පාර්ලිමේන්තුව විසින් (1) වන අනුව්‍යවස්ථාවට යටත්ව කොමිෂන් සභාවේ රැස්වීම් සඳහා ද, ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවාවක් ස්ථාපිත කිරීම සඳහා ද ඒ සඳහා සම්බන්ධිත වූ සහ ආනුෂංගික වූ වෙනත් කාරණා ද සඳහා විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

**කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍යය**

153ඇ. (1) ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය කිරීම් සහ සේවයෙන් පහ කිරීමේ බලය කොමිෂන් සභාවට පැවරෙන්නේ ය.

(2) කොමිෂන් සභාව විසින් පහත සඳහන් බලතල, කාර්ය සහ කර්තව්‍ය ද ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම, කළ යුත්තේ යː-

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයන්ගේ සේවයට බඳවා ගැනීමේ පටිපාටි, ඔවුන්ගේ පත්කිරීම්, මාරු කිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම්වලට අදාළ නීති රීති ඒවාට අදාළව අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ප්‍රතිපත්ති වලට යටත්ව සකස් කිරීම;

(ආ) නීතිය මගින් ස්ථාපිත ජාතික විගණන සේවයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම; සහ

(ඇ) නීතිය මගින් සලකනු ලබන පරිදි වූ වෙනත් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හා කිරීම.

(3) (2) වන අනුව්‍යවස්ථාව යටතේ සාදනු ලබන රීති කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය.

(4) එවැනි සෑම රීතියක්ම එසේ පළ කරනු ලැබූ දින සිට හෝ එම රීති මගින් නිශ්චිතව දක්වා ඇති යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුත්තේ ය.

(5) එවැනි සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට මාස තුනක කාලයක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුත්තේ ය. එසේ අනුමත කරනු නොලැබූ යම් රීතියක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු අතර, එමගින් පෙර කරන ලද කිසිවකට අගතියක් නොවිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ හෝ ශ්‍රී ලංකා විගණන සේවයේ තීරණයකට බලපෑම් කිරීම හෝ බලපෑම් කිරීමට තැත් කිරීම වරදක් බව

153ඈ. (1) තමාගේ රාජකාරි ක්‍රියාවලියේ දී නොවන අවස්ථාවක දී තමන් විසින් හෝ වෙනත් තැනැත්තකු හෝ මාර්ගයෙන්, කවර වූ හෝ ආකාරයෙන් කොමිෂන් සභාවේ තීරණයකට හෝ එකී සභාවේ යම් සාමාජිකයකුට හෝ ශ්‍රී ලංකා විගණන සේවයේ යම් නිලධරයකුට හෝ බලපෑම් කරන හෝ බලපෑම් කිරීමට තැත් කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර වරදකරු කිරීමේ දී රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද සෑම මහාධිකරණයකටම (1) වන අනුව්‍යවස්ථාවේ සඳහන් යම් කාරණයක් විභාග කොට තීරණය කිරීමට අධිකරණ බලය තිබිය යුත්තේ ය.

නීති කෘත්‍යවලින් මුක්තිය

153ඉ. 126 වන ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය පිරිනමා ඇති අධිකරණ බලයට සහ 153උ ව්‍යවස්ථාව යටතේ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියට ප්‍රදානය කොට ඇති බලතලවලට යටත්ව, මේ පරිච්ඡේදය යටතේ හෝ යම් ලිඛිත නීතියක් යටතේ කොමිෂන් සභාව වෙත පවරා දී ඇති යම් කර්තව්‍යයක් ඉටුකිරීමේ දී එකී සභාව විසින් දෙන ලද යම් නියමයක් හෝ කරන ලද යම් තීරණයක් ගැන විභාග කිරීමට, ප්‍රකාශ කිරීමට, හෝ කවර වූ හෝ ආකාරයකින් ප්‍රශ්න කිරීමට කිසිදු අධිකරණයකට හෝ විනිශ්චයාධිකරණයකට බලය හෝ අධිකරණ බලය නොතිබිය යුත්තේ ය.

පිරිවැය සහ වියදම්

153ඊ. කොමිෂන් සභාවේ පිරිවැය සහ වියදම් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුත්තේ ය.

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියට ඉදිරිපත් කරනු ලබන අභියාචන

153උ. කොමිෂන් සභාව විසින් තමන් සම්බන්ධයෙන් වූ යම් පත් කිරීමකට, උසස් කිරීමකට හෝ ස්ථාන මාරුවකට අදාළව කරන ලද යම් නියමයකින් හෝ විනය පිළිබඳ කාරණයක් මත හෝ සේවයෙන් පහකිරීමක් මත කරන ලද යම් නියමයකින් අතෘප්තියට පත් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ යම් නිලධරයකු විසින් එයට විරුද්ධව 59 වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියට අභියාචනයක් ඉදිරිපත් කිරීම කළ හැක්කේ ය. කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයක් හෝ දෙන ලද යම් තීරණයක් වෙනස් කිරීමට, සුළු වශයෙන් වෙනස් කිරීමට, ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට හෝ ස්ථිර කිරීමට එකී විනිශ්චය අධිකාරියට බලය ඇත්තේ ය.

කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු බව

153උෟ. කොමිෂන් සභාව එකී කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල විධිවිධානවලට අනුකූලව පාර්ලිමේන්තුවට වගකිව යුත්තේ ය. පිළිතුරු දීමට බැඳී සිටිය යුත්තේ ය. එසේම සෑම ලිත් වර්ෂයකදීම එහි ක්‍රියාකාරකම් පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**42.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව, එහි (1) ඡේදය ඉවත් කිරීමෙන් ද ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ද මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියලු දෙපාර්තමේන්තු, ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ගේ කාර්යාලය, 44 වන සහ 45 වන ව්‍යවස්ථා යටතේ පත් කරන ලද අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්යාල, අධිකරණ සේවා කොමිෂන් සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා, පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් ද ඒවායේ ගිණුම් ඇතුළුව විගණනය කරනු ලැබිය යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඊ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**43.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඊ වන ව්‍යවස්ථාව, එහි (2) සහ (3) අනුව්‍යවස්ථා ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**44.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ වන ව්‍යවස්ථාව, එහි (1) ඡේදයේ (ඇ) අනුඡේදයේ "41අ වන ව්‍යවස්ථාවේ" යන වචන වෙනුවට "41ඇ වන ව්‍යවස්ථාවේ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155අ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**45.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155අ වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එම ව්‍යවස්ථාවේ (1) ඡේදයේ "පස්දෙනෙකුට නොඅඩු සහ සාමාජිකයන් හත්දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින්" යන වචන වෙනුවට "හත්දෙනෙකුගෙන්" යන වචනය ආදේශ කිරීමෙන් ;

(ආ) එම ව්‍යවස්ථාවේ (1) ඡේදයේ "41අ වන ව්‍යවස්ථාවේ" යන වචන වෙනුවට "41ආ වන ව්‍යවස්ථාවේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එම ව්‍යවස්ථාවේ (1) ඡේදයේ "ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය" යන වචනවලට පෙරාතුව "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත" යන වචනය ඇතුළත් කිරීමෙන්";

(ඈ) එම ව්‍යවස්ථාවේ (4) ඡේදයේ "ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත්" යන වචන වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ඇතුව ජනාධිපතිවරයා විසින් හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත්" යන වචන ආදේශ කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඇ වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**46.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඇ ව්‍යවස්ථාව, එහි "126 වන ව්‍යවස්ථාවේ (1) වන ව්‍යවස්ථාවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා දී ඇති බලයට යටත්ව" යන වචන වෙනුවට "126 වන ව්‍යවස්ථාවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පවරා දී ඇති බලයට යටත්ව සහ 155ඔ ව්‍යවස්ථා මගින් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ප්‍රදානය කොට ඇති බලතලවලට යටත්ව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊඊ වන ව්‍යවස්ථාව අහෝසි කිරීම

**47.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊඊ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

**48.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊඊඊ ව්‍යවස්ථාවට ඉක්බිතිවම පහත දක්වෙන ව්‍යවස්ථා ඇතුළත් කරනු ලබන අතර එකී ව්‍යවස්ථා පිළිවෙලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ, 155ඌ, 155එ, 155ඒ සහ 155ඔ ව්‍යවස්ථා ලෙස බලපැවැත්විය යුතු යः- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 උ-ඔ වන ව්‍යවස්ථාවන් ඇතුළත් කිරීම

"කොමිෂන් සභාවේ බලතල

155උ. (1) (අ) පොලිස්පතිවරයා හැර, පොලිස් නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, මාරු කිරීමේ, ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාමේ සහ ඔවුන් සේවයෙන් පහකිරීමේ බලය කොමිෂන් සභාව වෙත පැවරිය යුත්තේය. උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම් පිළිබඳ කොමිෂන් සභාවේ බලතල පොලිස්පතිවරයා විමසා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ ය.

(ආ) මේ ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පළාත් පොලිස් කොමිෂන් සභා පිහිටුවනු ලබන පරිදි සහ පිහිටුවනු ලබන විට ඒ පළාත් පොලිස් කොමිෂන් සභා වෙත පවරනු ලබන බලතල සහ කාර්ය හීන කිරීමක්, කොමිෂන් සභාව විසින් නොකළ යුත්තේ ය.

(2) මහජනයාගෙන් ලැබෙන පැමිණිලි සහ අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින් පොලිස් නිලධරයකුට හෝ පොලිස් සේවයට හෝ විරුද්ධව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාරගැනීමේ හා ඒවා විමර්ශනය කිරීමේ කාර්ය පටිපාටි කොමිෂන් සභාව විසින් පිහිටු විය යුතු අතර, පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මගින් සලසා ඇති පරිදි සහන සැලසිය යුත්තේ ය. කොමිෂන් සභාව විසින් සහන සැලසීමේ දී පොලිස්පතිවරයාට එය විසින් ඒ බව වහාම දැනුම් දිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාව විසින්, පොලිස්පතිවරයා විමසා -

(අ) තත් කාර්යය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම්

ප්‍රතිපත්තියකට යටත්ව පොලිස් නිලධරයන් බඳවා ගැනීම, උසස් කිරීම සහ ස්ථාන මාරු කිරීම පිළිබඳ පටිපාටි සකස් කිරීම;

(ආ) පුහුණුව සහ පොලිස් සේවයේ කාර්යක්ෂමතාව හා ස්වාධීනත්වය වැඩි දියුණු කිරීම;

(ඇ) ජාතික අංශයේ සහ පළාත් අංශයේ භාවිතය සඳහා අවශ්‍ය අවිආයුධ, වෙඩි ද්‍රව්‍ය සහ වෙනත් උපකරණවල ස්වභාවය සහ වර්ගය; සහ

(ඈ) චර්යා සංග්‍රහ සහ විනය පිළිබඳ පටිපාටි,

ඇතුළුව පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් වූ සියලු කාරණා සඳහා සැලසීම ද නිශ්චය කිරීම ද කරනු ලැබිය යුත්තේ ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ 1 වන පරිශිෂ්ටය යටතේ කොමිෂන් සභාව වෙත පවරා ඇති සියලුම බලතල ක්‍රියාත්මක කිරීම හා සියලු කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ ඇතැම් බලතල කමිටුවකට පැවරීම

155උ९. (1) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන ශ්‍රේණිවල පොලිස් නිලධරයන් පත්කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ සහ ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීමේ සහ ඔවුන් සේවයෙන් පහකිරීමේ ලා කොමිෂන් සභාව සතු බලතල කොමිෂන් සභාව විසින් නම් කරනු ලැබිය යුතු (කොමිෂන් සභාවේ සාමාජිකයන්ගෙන් සමන්විත නොවන) කමිටුවක් වෙත, කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් කමිටුවක් පත්කිරීම කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරවනු ලැබිය යුත්තේ ය.

(3) (1) වන අනුව්‍යවස්ථාව යටතේ නම් කරනු ලබන කමිටුවක රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල ගණපූරණය, කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීතිවලට අනුකූල විය යුත්තේ ය. කොමිෂන් සභාව විසින් ඒ රීති ගැසට් පත්‍රයේ පළ කරවනු ලැබිය යුත්තේය.

කොමිෂන් සභාව විසින් ඇතැම් කාර්ය පැවරීම

155එ. (1) යම් ශ්‍රේණියක පොලිස් නිලධරයන් පත් කිරීම, ඔවුන් උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීම සහ සේවයෙන් පහකිරීම සඳහා කොමිෂන් සභාව සතු බලතල, කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කොන්දේසිවලට සහ කාර්ය පටිපාටියට යටත්ව, පොලිස්පතිවරයා වෙත හෝ පොලිස්පතිවරයා විසින් යම් පොලිස් නිලධරයකු වෙත කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් බලතල පැවරීමක්, කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්විය යුත්තේ ය.

අභියාචන කිරීමේ අයිතිය

155ඒ. (1) කවර හෝ කාණ්ඩයකට අයත් පොලිස් නිලධරයන්ගේ උසස්වීමක් හෝ ස්ථාන මාරුවක් හෝ ඔවුන් සම්බන්ධයෙන් යම් විනය කාරණයක් හෝ ඔහු සේවයෙන් පහකිරීමක් හෝ පිළිබඳව කොමිෂන් සභාවට ඇති බලතල කොමිෂන් සභාව විසින් 155එ ව්‍යවස්ථාව යටතේ යම් පොලිස් නිලධරයකුට පවරා ඇති අවස්ථාවක එකී පොලිස් නිලධරයා විසින් එසේ තමන්ට පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමේ දී දෙන ලද යම් නියමයකට විරුද්ධව කොමිෂන් සභාවට අභියාචනය කිරීමට පොලිස්පතිවරයාට අයිතිය ඇත්තේ ය.

(2) පොලිස්පතිවරයා හෝ 155ඌ සහ 155එ ව්‍යවස්ථාවල සඳහන් කමිටුවක් හෝ පොලිස් නිලධරයකු හෝ විසින් තමාගේ යම් උසස් කිරීමක්, ස්ථාන මාරුවක් හෝ සේවයෙන් පහකිරීමක් සම්බන්ධයෙන් කරන ලද යම් නියමයකින් අතෘප්තියට

පත් පොලිස් නිලධරයෙකු විසින් අභියාචනයක් කිරීම සහ අභියාචනයක් විභාග කිරීම සඳහා නියම කරනු ලැබ ඇති පටිපාටි ද, කාලය ද, විධිමත් කරමින් කොමිෂන් සභාව විසින් කලින් කල සාදනු ලබන රීතිවලට අනුකූලව, එකී නියමයට විරුද්ධව කොමිෂන් සභාවට අභියාචනය කරනු ලැබිය හැක්කේය.

(3) (1) වන හෝ (2) වන අනුව්‍යවස්ථා යටතේ කරන ලද අභියාචනයක් මත දෙන ලද එකී නියම වෙනස් කිරීමේ, සුළු වශයෙන් වෙනස් කිරීමේ, ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ හෝ ස්ථිර කිරීමේ හෝ ඒ සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමේ හෝ තවදුරටත් වූ හෝ වෙනත් හෝ පරීක්ෂණයක් පැවැත්වීමට නියම කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාව විසින් කලින් කල සාදනු ලබන රීති ගැසට් පත්‍රයේ පළ කරවනු ලැබිය යුත්තේ ය.

(5) අවස්ථාවොචිත පරිදි මේ පරිච්ඡේදයේ 155උෟ හෝ 155එ ව්‍යවස්ථා යටතේ කමිටුවක් වෙත හෝ පොලිස්පතිවරයා වෙත හෝ පොලිස් නිලධරයකු වෙත බලතල පවරා දෙනු ලැබූ විට කොමිෂන් සභාව විසින් එසේ පවරන ලද බලතල බලාත්මකව පවතිද්දී, ඒ බලතල පැවරීම කරන ලද්දේ යම් ශ්‍රේණියක පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් ද ඒ ශ්‍රේණියේ පොලිස් නිලධරයන් සම්බන්ධයෙන්, මෙහි ඉහත විධිවිධාන සලස්වා ඇති පරිදි අභියාචනය කිරීමේ අයිතියට යටත්ව, කොමිෂන් සභාව විසින් ඒ බලතල පාවිච්චි කිරීම හෝ ඒ කාර්ය හෝ කර්තව්‍ය ඉටුකිරීම නොකරනු ලැබිය යුත්තේ ය.

**පරිපාලන අභියාචන විනිශ්චයාධිකාරය වෙත අභියාචන කිරීම**

155ඔ. තමන්ගේ උසස්වීමක් හෝ ස්ථාන මාරුවක් හෝ තමා සම්බන්ධයෙන් වූ විනය පිළිබඳ කාරණයක දී හෝ සේවයෙන් පහකිරීමක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කරන ලද නියමයකින් අතෘප්තියට පත් යම් පොලිස් නිලධරයකු විසින් ඊට

විරුද්ධ අභියාචනයක්, 59 වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පරිපාලන අභියාචන විනිශ්චයාධිකාරය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැක්කේ ය. කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයක් හෝ තීරණයක් වෙනස් කිරීමේ, සුළු වශයෙන් වෙනස් කිරීමේ හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ බලය ඒ විනිශ්චයාධිකාරයට ඇත්තේය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඕ වන ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම

**49.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඕ ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ:-

"දැනට බලපවත්නා රීති සහ නියෝග ශේෂ කිරීම

155ඕ. කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වනු ලබන තෙක්, මේ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමේ දිනයේ දී පොලිස් බලකායට අදාළව බලාත්මකව පවතින සියලු රීති, නියෝග සහ කාර්ය පටිපාටි ක්‍රියාත්මකව සහ බලාත්මකව පැවතිය යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම

**50.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එම ව්‍යවස්ථාවේ (2) අනුව්‍යවස්ථාවේ "41අ වන ව්‍යවස්ථාවේ" යන වචන වෙනුවට "41 ඇ වන ව්‍යවස්ථාවේ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම ව්‍යවස්ථාවේ (2) අනුව්‍යවස්ථාවේ "ඒ කොමසාරිස්වරයා යථා පැවැත්මෙන් සිටින තාක් ස්වකීය ධුරය දැරිය යුත්තේ ය." යන වචන ඉවත් කිරීමෙන්;

(ඇ) එම ව්‍යවස්ථාවේ (4) අනුව්‍යවස්ථාවේ (ඇ) අනුඡේදයේ "ජනාධිපතිවරයා" යන වචනයට පෙරාතුව "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත" යන වචන ඇතුළත් කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIXඅ, XIXආ, XIXඇ සහ XIX ඈ වන පරිච්ඡේද ඇතුළත් කිරීම

**51.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIX පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන පරිච්ඡේද ඇතුළත් කරනු ලබන අතර ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIX අ, XIX ආ, XIX ඇ සහ XIX ඈ පරිච්ඡේද ලෙස බලපැවැත්විය යුතු යː-

## XIXඅ පරිච්ඡේදය

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාව

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාව

156අ. (1) පාර්ලිමේන්තුව විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම පිණිස නීතියක් මගින් සැලැස්විය යුත්තේ ය. එකී නීතිය මගින් -

(අ) ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීම ;

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනාවක් සම්බන්ධයෙන් තමාගේම මෙහෙයවීමෙන් හෝ වෙනත් තැනැත්තකු විසින් කරනු ලබන පැමිණිල්ලක් මත යම් අල්ලස් හෝ දූෂණ චෝදනාවක් පිළිබඳව මූලික පරීක්ෂණයක් පැවැත්වීමට හෝ විමර්ෂණයක් කිරීමට විධාන කිරීම සඳහා වූ බලතල සහ අල්ලස් හෝ දූෂණවලට අදාළව, බලපවත්නා නීතිය යටතේ වැරදි සඳහා නඩු පැවරීමට ඇති බලතල ද ඇතුළු කොමිෂන් සභාවේ බලතල; සහ

(ඇ) ශ්‍රී ලංකාව පාර්ශ්වයක් වන, දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ දූෂණය වැළැක්වීමට අදාළ වෙනත් යම් ජාත්‍යන්තර සම්මුති ක්‍රියාත්මක කිරීම පිණිස ගත යුතු පියවර සඳහා,

විධිවිධාන සැලැස්විය යුතු ය.

(2) පාර්ලිමේන්තුව විසින් එසේ විධිවිධාන සලස්වන තෙක්, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව පනත යටතේ පත් කරනු ලැබූ කොමිෂන් සභාව විසින් තම මෙහෙය වීමෙන් ම හෝ එය වෙත කරන ලිඛිත පැමිණිල්ලක් මත යම් අල්ලස් හෝ දූෂණ

චෝදනාවක් විභාග කිරීම හෝ විමර්ශනය කිරීම නීත්‍යානුකූල බවට වූ සුලු වෙනස් කිරීමට යටත්ව, එකී පනත අදාළ විය යුත්තේ ය.

## XIX ආ පරිච්ඡේදය

### ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

156ආ. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නා වූ ද සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත වූ ද (මේ පරිච්ඡේදයේ "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවක් තිබිය යුත්තේ ය. එකී සභාවේ යටත් පිරිසෙයින් සාමාජිකයන් තිදෙනකු ප්‍රසම්පාදනය, ගණකාධිකරණය, නීතිය හෝ රාජ්‍ය පරිපාලනය පිළිබඳ පිළිගත් අත්දැකීම් සහිත තැනැත්තන් විය යුතු ය. ජනාධිපතිවරයා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කළ යුත්තේ ය.

(2) සභාවේ සෑම සාමාජිකයකු ම විසින් ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් තම ධුරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය මත හේතු දක්වා ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ඔහු වරදකරු කරනු ලැබුව හොත් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු හෝ වශයෙන් තේරී පත් වුවහොත් හෝ ඔහු විෂයෙහි ප්‍රජා අශක්නුතා නියම කිරීමේ යෝජනා සම්මතයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන ව්‍යවස්ථාවට අනුකූලව සම්මත කරනු ලැබුවහොත් හෝ මිස, එවැනි සාමාජිකයකු වශයෙන් ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුර දැරිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සෑම සාමාජිකයකුටම, පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ දීමනාවක් ගෙවිය යුත්තේ ය. එකී දීමනාව ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු අතර, එකී සභාපතිවරයාගේ හෝ සාමාජිකයාගේ ධුර කාලය අතරතුර අඩු නොකළ යුත්තේ ය.

සභාවේ කර්තව්‍ය

156ඇ. (1) සියලු රජයේ ආයතන විසින් භාණ්ඩ සහ සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය කරනු ලැබීම සම්බන්ධයෙන් සාධාරණ, යුක්ති සහගත, විනිවිද පෙනෙන සුළු, තරඟකාරී සහ වියදම් සඵලතාවයකින් යුත් පටිපාටි සහ උපමාන සකස් කිරීම කොමිෂන් සභාවේ කර්තව්‍ය වන්නේ ය. කොමිෂන් සභාව විසින් එකී උපමාන *ගැසට් පත්‍රයේ* පළ කිරීමට සැලසිය යුතු අතර, එකී පළ කිරීමෙන් මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කිරීමට සැලසිය යුත්තේ ය.

(2) (1) වන අනුව්‍යවස්ථාවේ පොදුභාවයට අගතියක් නොමැතිව -

(අ) රජයේ ආයතන විසින් කරනු ලබන භාණ්ඩ සහ සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය, පූර්වයේ අනුමත වූ ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව පිළියෙල කරන ලද ප්‍රසම්පාදන ක්‍රම මත පදනම්ව ඇත් ද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීම;

(ආ) රජයේ ආයතනවලට භාණ්ඩ හා සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති සැපයීම සඳහා වූ සියලු සුදුසුකම් ලත් ලංසුකරුවන්ට එකී භාණ්ඩ හා සේවා සැපයීම සඳහා වූ ලංසු තැබීමේ ක්‍රියාවලියට සහභාගීවීම පිණිස සමාන

අවස්ථා ලබා දී ඇත් ද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීම;

(ඇ) රජයේ ආයතනවලට භාණ්ඩ හා සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති සැපයීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තේරීමේ සහ කොන්ත්‍රාත් ලබා දීමේ ක්‍රියා පටිපාටිය සාධාරණ හා විනිවිද පෙනෙන සුලු වන්නේ ද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීම;

(ඈ) රජයේ ආයතන විසින් කරනු ලබන ප්‍රසම්පාදනයන්ට සම්බන්ධිත සැපයුම් කමිටු සහ තාක්ෂණික ඇගයුම් කමිටුවල සාමාජිකයන් යෝග්‍ය පරිදි සුදුසුකම් ලබා ඇත් ද යන්න පිළිබඳව වාර්තා කිරීම; සහ

(ඉ) රජයේ ආයතන විසින්, පිළිගත් පටිපාටිවලින් සහ මෙහෙයුම් නිර්ණායක වලින් බැහැරව කරන ලද ප්‍රසම්පාදන වාර්තා විමර්ශනය කිරීම සහ එකී ප්‍රසම්පාදන සම්බන්ධයෙන් වගකිව යුතු නිලධරයන් අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අදාළ බලධාරීන්ට වාර්තා කිරීම,

සභාවේ කර්තව්‍ය වන්නේ ය.

කොමිෂන් සභාවේ බලතල

156ඈ. (1) කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකුට ලිඛිත දැන්වීමක් මගින් -

(අ) ප්‍රශ්න කරනු ලැබීම සඳහා කොමිෂන් සභාව ඉදිරියට පැමිණිය යුතු බවට;

(ආ) එකී දැන්වීමේ නිශ්චිතව දක්වනු ලබන්නා වූ ද එකී තැනැත්තාගේ සන්තකයේ හෝ පාලනයේ තිබෙන්නා වූ ද යම් ලේඛනයක් හෝ දෙයක් සභාවට ඉදිරිපත් කළ යුතු බවට,

නියාමනය කරනු ලැබිය හැක්කේ ය.

(2) (අ) (1) වන අනුව්‍යවස්ථාව යටතේ යවනු ලැබූ දැන්වීමක් මගින් කොමිෂන් සභාව ඉදිරියට පැමිණිය යුතු බවට නියම කරනු ලැබ සාධාරණ හේතුවක් නොමැතිව එකී සභාව ඉදිරියට පැමිණීමට අපොහොසත් වන;

(ආ) එවැනි දැන්වීමකට අනුකූල වෙමින් කොමිෂන් සභාව විසින් ඔහුට ඉදිරිපත් කරනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරුදීම සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන; හෝ

(ඇ) (1) වන අනුව්‍යවස්ථාව යටතේ ඔහුට යවනු ලැබූ දැන්වීමක් මගින් ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ යම් ලේඛනයක් හෝ දෙයක්, සාධාරණ හේතුවක් නොමැතිව, ඉදිරිපත් කිරීමට අපොහොසත්වන හෝ ප්‍රතික්ෂේප කරන,

සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර වරදකරු කිරීමේ දී රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු හතක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුත්තේ ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබූ සෑම මහාධිකරණයකටම ඉහත (2) වන අනුව්‍යවස්ථාවේ සඳහන් යම් කාරණයක් විභාග කොට තීරණය දීමට අධිකරණ බලය ඇත්තේ ය.

සභාවේ රැස්වීම්

156ඉ. (1) කොමිෂන් සභාව, එහි කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි කවර හෝ වාර ගණනක් රැස්විය යුත්තේ ය.

(2) කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය සභාපතිවරයා විසින් දැරිය යුත්තේ ය. කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා

සභාපතිවරයා නොපැමිණි විට දී පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරෙන් සාමාජිකයකු එකී රැස්වීම සඳහා තෝරා පත්කර ගත යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත වන්නේ ය.

(4) කොමිෂන් සභාවේ තීරණ, එකී තීරණ ගනු ලබන්නේ යම් රැස්වීමකදී ද, එකී රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් විය යුත්තේ ය. ඡන්ද සමාන වන විටක සභාපතිවරයාට හෝ එකී රැස්වීමේ මූලාසනය දරන සාමාජිකයකුට තීරක ඡන්දයක් ඇත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාවේ ඉහත විධිවිධානවලට යටත්ව කොමිෂන් සභාව විසින් එහි රැස්වීම් සහ එකී රැස්වීම්වල කටයුතු පිළිබඳ පටිපාටි නිශ්චය කරගනු ලැබිය හැක්කේ ය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීම නොතකා කටයුතු කිරීමට කොමිෂන් සභාවට බලය ඇති අතර, එවැනි පුරප්පාඩුවක් තිබීමේ හේතුව හෝ යම් සාමාජිකයකුගේ පත් වීමේ යම් දෝෂයක් තිබීම නිසාම පමණක් කොමිෂන් සභාවේ ක්‍රියාවන්, පටිපාටියක් හෝ තීරණයක් බල රහිත නොවිය යුත්තේ ය. බල රහිත වන ලෙස නොසැලකිය යුත්තේ ය.

සභාවේ කාර්ය මණ්ඩලය

156ඊ. (1) කොමිෂන් සභාව විසින්, එය විසින් නිශ්චය කරගනු ලැබිය හැකි නියම සහ කොන්දේසි මත, එහි කාර්ය නිසි පරිදි ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන පරිදි මහලේකම්වරයකු ද, වෙනත් යම් නිලධරයන් ද කොමිෂන් සභාවට පත්කරගනු ලැබිය යුත්තේ ය.

(2) කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන් සහ නිලධරයන් දණ්ඩ නීති සංග්‍රහයේ IX වන පරිච්ඡේදයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු හෝ විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඔහුගේ කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමේ දී හෝ කිරීමේ දී සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් හෝ නඩු කටයුත්තක් හෝ වෙනත් කෘත්‍යයක් පැවරිය නොහැක්කේ ය.

සභාවේ වියදම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු බව

156උ. කොමිෂන් සභාවේ වියදම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුත්තේ ය.

අර්ථ නිරූපණය

156ඌ. මේ පරිච්ඡේදයේ 'රජයේ ආයතනය' යන්නට, අමාත්‍යාංශයක්, රජයේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක්, පළාත් පාලන ආයතනයක්, රජයට පවරා ගත් යම් වෙළඳ ව්‍යාපාරයක් හෝ රජයට පවරා ගත් වෙනත් ව්‍යාපාරයක් සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සලකනු ලබන්නා වූ ද රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් සියයට පනහකට වැඩි කොටස් දරන්නා වූ ද යම් සමාගමක් ද ඇතුළත් වේ.

## XIXඇ පරිච්ඡේදය

### ජාතික ආරක්ෂක මණ්ඩලය

ජාතික ආරක්ෂක මණ්ඩලය

156ඒ. (1) ජාතික ආරක්ෂක මණ්ඩලයක් තිබිය යුතු අතර-

(අ) අග්‍රාමාත්‍යවරයා;

(ආ) ආරක්ෂක අමාත්‍යවරයා;

(ඇ) ජාතික ආරක්ෂාව විෂය භාර පාර්ලිමේන්තුවේ අධීක්ෂණ කාරක සභාවේ සභාපති;

(ඈ) පොලිස්පති;

(ඉ) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා;

(ඊ) නීතිපති; සහ

(උ) නීතියෙන් තීරණය කළ හැකි වෙනත් රාජ්‍ය නිලධාරීන් හෝ පුද්ගලයන්,

එහි සාමාජිකයන් වන්නේය.

(2) අග්‍රාමාත්‍යවරයා ජාතික ආරක්ෂක මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය. අග්‍රාමාත්‍යවරයා නොමැති අවස්ථාවක ජාතික ආරක්ෂක මණ්ඩලයේ රැස්වීම්වල මුලසුන හොබවන්නේ ආරක්ෂක අමාත්‍යවරයා විසිනි.

(3) ජාතික ආරක්‍ෂක මණ්ඩලයේ බලතල සහ කර්තව්‍යයන් සඳහා සහ ඒ හා සම්බන්ධ අනෙකුත් කාරණා සඳහා පාර්ලිමේන්තුව නීතියෙන් විධිවිධාන සැලසිය යුතු ය.

(4) මෙහි (3) අනුව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි නීතියක් බලාත්මක වන තුරු, ජාතික ආරක්ෂක මණ්ඩලය එහි රැස්වීම් සම්බන්ධයෙන් සුදුසු යැයි සිතන ක්‍රියා පටිපාටි අනුගමනය කළ යුතු ය.

## XIX ඈ පරිච්ඡේදය

### රාජ්‍ය සභාව

රාජ්‍ය කවුන්සිලය

156ඔ. (1) ජාතික වැදගත්කමක් ඇති විෂයයන් සාකච්ඡා කිරීමට රාජ්‍ය සභාවක් තිබිය යුතු ය.

(2) රාජ්‍ය සභාව, මහජනතාවට රජයට උපදෙස් ලබාදිය හැකි මණ්ඩපයක් වන අතර, එම උපදෙස් මත ක්‍රියා කිරීමට රජය බැඳී නොමැත.

(3) අග්‍රාමාත්‍යවරයා විසින් සභාපතිත්වය දරන සභාව සමන්විත වන්නේ-

(i) මුදල් අමාත්‍යවරයා;

(ii) විදේශ කටයුතු අමාත්‍යවරයා;

(iii) ආරක්ෂක අමාත්‍යවරයා;

(iv) කථානායක;

(v) විපක්ෂ නායක;

(vi) අග්‍රාමාත්‍යවරයා සහ විපක්ෂ නායකවරයා නියෝජනය කරන පක්ෂ හැර පාර්ලිමේන්තුවේ අනෙකුත් පක්ෂ නියෝජනය කිරීමට එක් මන්ත්‍රීවරයකු;

(vi) නීතිපති; හා

(viii) ව්‍යාපාර, ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, නීතිය, ජාත්‍යන්තර සබඳතා සහ විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ විශේෂඥ ක්ෂේත්‍ර නියෝජනය කිරීමට තෝරා ගත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන තවත් සාමාජිකයක් දෙළොස් දෙනෙක්. එවැනි සාමාජිකයන් පත්කිරීමේ දී, ස්ත්‍රී පුරුෂ භාවය සහ තරුණයින් නියෝජනය වීම ඇතුළුව ශ්‍රී ලංකාවේ බහුත්වවාදී ස්වභාවය නියෝජනය වීම පිළිබඳව නිසි සැළකිල්ලක් දක්විය යුතු ය.

(4) පාර්ලිමේන්තුව විසින් රාජ්‍ය කවුන්සිලයේ කාර්යයන් සහ ක්‍රියා පටිපාටි පිළිබඳව නීතියක් මගින් විධිවිධාන සැලැස්විය යුතු ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**52.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එහි "රජයේ නිලධරයා" යන්නෙහි නිර්වචනයේ (උ) ඡේදයේ "පාර්ලිමේන්තු සභාවේ" යන වචන ඉවත් කර ඒ වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව" යන වචන ආදේශ කිරීම මඟින්;

(ආ) එහි "රාජ්‍ය නිලධාරියා" යන්නෙහි නිර්වචනයේ (එ) ඡේදයේ "41අ" යන වචන ඉවත් කර ඒ වෙනුවට "41ආ" යන වචන ආදේශ කිරීම මගින්.

අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**53.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන

**54.** සැක දුරු කිරීම සඳහා පහත සඳහන් ලෙස ප්‍රකාශ කරනු ලැබේ:-

(1) මෙම පනත ක්‍රියාත්මක වනු ලබන දිනයට පෙරාතුවම වූ දිනයේ දී -

(i) අග්‍රවිනිශ්චයකාරවරයා;
(ii) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්;
(iii) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්;
(iv) අභියාචනාධිකරණයේ සභාපතිවරයා;
(v) අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවයන්;
(vi) නීතිපතිවරයා;
(vii) විගණකාධිපතිවරයා;
(viii) පොලිස්පතිවරයා;
(ix) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වරයා;
(x) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා;
(xi) මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු;
(xii) අධිකරණ නිලධරයකු, උපලේඛනගත රජයේ නිලධරයකු, රජයේ නිලධරයකු හෝ පොලිස් නිලධරයකු; හෝ
(xiii) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති,

වශයෙන් ධුර දරන සෑම තැනැත්තකු ම තව දුරටත් එම ධුර දරනු ලැබිය යුතු අතර, 41ඇ ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාවට යටත්ව එම නියම හා කොන්දේසි යටතේ එම ධුරයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම කරනු ලැබිය යුතු වන්නේ ය.

(2) මෙම පනත ක්‍රියාත්මක වනු ලබන දිනයට පෙරාතුවම දිනයේ දී-

(අ) පාර්ලිමේන්තු සභාවේ;

(ආ) මැතිවරණ කොමිෂන් සභාවේ;

(ඇ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ;

(ඈ) ජාතික පොලිස් කොමිෂන් සභාවේ;

(ඉ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ;

(ඊ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ;

(උ) මුදල් කොමිෂන් සභාවේ;

(ඌ) තොරතුරු දැනගැනීම අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ;

(එ) කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාවේ; හෝ

(ඒ) (සභාපති සහ මුදල් අමාත්‍යාංශය භාර අමාත්‍යවරයාගේ ලේකම් හැර) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ සාමාජිකයින්,

සභාපතිවරයා හෝ සාමාජිකයකු හෝ ලෙස ධුර දරන සෑම තැනැත්තකුම මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ධුර දැරීම අවසන් කළ යුත්තේ ය:

එසේ වුව ද, මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී ඉහත සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු හෝ වශයෙන් ධුර දරන සෑම තැනැත්තකුම එකී අදාළ කොමිෂන් සභා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ පරිච්ඡේදයට අනුකූලව ස්ථාපිත කරනු ලබන දිනය තෙක් තම අදාළ ධුරවල බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම දිගටම කරගෙන යනු ලැබිය යුත්තේ ය.

(3) මෙම පනත ක්‍රියාත්මක වන දිනයට පෙරතුවම වූ දිනයේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරියේ පවත්නා-

(අ) පොලිස් නිලධාරියගේ පත්කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම් සම්බන්ධ සියලු කාරණා ; සහ

(ආ) පොලිස් නිලධරයන් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවල ඉදිරිපත් කරන ලද සියලු අභියාචනා,

එම දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි 155අ ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු අතර, ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඒවා තීරණය කරනු ලැබිය යුත්තේ ය.

(4) මෙම පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරියේ පවත්නා ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයන්ගේ පත්කිරීම්, උසස්වීම්, මාරු කිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම පිළිබඳ සියලු කාරණා සහ එම දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි 153අ ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද විගණන සේවා කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු අතර ඒ අනුව විගණන සේවා කොමිෂන් සභාව ඒවා සම්බන්ධයෙන් තීරණය කරනු ලැබිය යුත්තේ ය.

(5) මෙම පනත ක්‍රියාත්මක වන දිනට පෙර දින පැවති නවවැනි පාර්ලිමේන්තුව, වර්ෂ 2020 අගෝස්තු මස 20 වන දින එහි ප්‍රථම රැස්වීම පැවැත්වූවා සේ සළකනු ලැබිය යුතු අතර, එය කලින් විසුරුවා හරිනු ලැබුවහොත් මිස එදින සිට වසර පහක කාලයකට ක්‍රියාත්මක විය යුත්තේ ය.

(6) මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ ජනාධිපති ලෙස ධුර දරන පුද්ගලයා වර්ෂ 2019 නොවැම්බර් මස 17 වන දින තේරී පත්වී ප්‍රකාශ වූවා සේ සළකනු ලැබිය යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව එදින සිට වසර පහක කාලයකට එම ධුරය දරනු ඇත.

(7) සැක දුරුකිරීම සඳහා, පාර්ලිමේන්තු සභාවේ නිර්දේශය හෝ අනුමැතිය ලබා ගැනීම සඳහා කිසියම් ලිඛිත නීතියක අවශ්‍යතාවයක් පවතින විට, පාර්ලිමේන්තු සභාව පිළිබඳ සඳහනක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සම්බන්ධයෙන් වන සඳහනක් ලෙස අර්ථ දැක්විය යුතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.